# I-1961 ආර්ථික ප්‍රශ්න සහ ප්‍රතිපත්ති

## හැඳින්වීම

මුදල් හා මූල්‍ය තත්ත්වය සම්බන්ධයෙන් ලංකාව මුහුණ පා තිබෙන ප්‍රධාන ප්‍රශ්න දෙක ගැන 1960 මහ බැංකු වාර්තාවෙන් අවධානය යොමු කැරිණි. එක් අතකින් රටේ විදේශීය වත්කම් නොකඩවාම වේගයෙන් පිරිහී යාම වලක්වාලනු පිණිස ආනයන පරිමාව සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු කැරීමේ අවශ්‍යතාවය ය; අනෙක් අතින් රටේ විදේශීය ගෙවුම් තත්ත්වයෙහි සමතුලිත තාවය නැති කරන මූලික හේතුව වී පවත්නා අධික මුදල් ප්‍රසාරණය කපා හැරීමේ අවශ්‍යතාවයයි.

1961 දී මේ ඉලක්කයට ලඟාවීමේ අභිලාශයෙන් මෙහෙයවුනු දැඩි විධිවිධාන හේතු කොට, ආනයන පරිමාව සහ වටිනාකම සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු කර ගැනීමට ලංකාව සමත් විය. පිටරට යවන භාණ්ඩ මිල අඩු වුවද මේ විධිවිධානවල ප්‍රතිඵලයක් වශයෙන් විදේශීය ගෙවුම් ශෙෂයෙහි ඇති වූ පරතරය සහ ඒ නිසා උද්ගත වන විදේශීය වත්කම් පිරිහීයාම සෑහෙන ප්‍රමාණයකින් අඩු කර ගැනීමට ලංකාවට පිළිවන් විය. ලංකාවේ විදේශීය ගෙවුම් ශෙෂ තවමත් අවාසි සහගත වෙමින් පවතින්නේ වුවද, පසුගිය වර්ෂවල දීට වඩා 1961 එහි සැලකිය යුතු දියුණුවක් පෙන්නුම් කළේය.

එහෙත්, රට අභ්‍යන්තරයෙහි ඇති වූ මූල්‍ය ප්‍රසාරණය කපා හැරීම සඳහා ලංකාව ගත් නැත එතරම් සාර්ථක වූයේ නොවේ. මෑත වර්ෂවල දී රජයේ මුළු අය වැය ලේඛන හිඟයන් විශාල ලෙස වැඩි වූයේ එය මුදල් ප්‍රසාරණයෙහිලා බලපවත්වන ප්‍රධානතම හේතුව විය. 1960 – 61 අය වැය ලේඛනයෙන් අමතර ආදායම් ලබා ගැනීමටත්, අය වැය පරතරය පියවා ගැනීමටත් විධිවිධාන සමහරක් පනවන ලදී. මේ විධිවිධානවලින් මුළු ආදායම සැලකිය යුතු ප්‍රමාණයකින් වැඩි වුවද, බලා-පොරොත්තු වූ පමණට වැඩි නොවූයෙන් වැඩි වූ මුළු වියදම පියවා ගැනීමට මඳ විය. මෙහි පල විසින් මුළු අය වැය හිඟය සහ උද්ධමනාත්මක ලෙස හිඟය පියවූ ප්‍රමාණය මෙයට මුලින් වර්ෂවලදී පැවැති ප්‍රමාණයට වාගේ විශාල විය. මෙයට හේතු වූයේ මිල පහළ වැටීමත් සමග පිටරට පටවන බඩුවලින් ලැබූ ආදායම අඩුවීමත්, අලුත් අයබදු සඳහා ව්‍යවස්ථා පමාවත්, පිටරටවලින් ලැබුණ ණය අඩුවීමත් ය.

මෙරටට ගෙන්වන බඩු ප්‍රමාණය සීමා කොට තිබෙන අවදියක නොකඩවාම මුදල් ප්‍රසාරණය ඇතිවීම නිසා ලංකාවට අලුත් ප්‍රශ්නවලට මුහුණ පෑමට සිදු විය. මෙය විශේෂයෙන්ම මිල මට්ටම කෙරෙහි බලපෑමක් ඇති කරන අතර මැඩ නොපැවැත්වූවහොත් රටේ ආර්ථික තත්වය කෙරෙහි අයහපත් ලෙස බලපාන්නේ වෙයි. පිටරටින් ගෙන් වූ බඩු තොග තුබූ නිසා 1961 දී ලංකාවේ මිල මට්ටම මේබලපෑම්වලින් බොහෝ දුරට ආරක්ෂා විය. මෙය දිගටම කර ගෙන ගිය හැක්කේ නොවේ. එම නිසා මුදල් ප්‍රසාරණය මැඩ පැවැත්වීමේ සහ මෙරට නිෂ්පාදනය වැඩි කිරීමේ ඇති අත්‍යාවශ්‍යකම අවධාරණයෙන් සඳහන් කළ යුතුය.

1961 දී ලංකාවේ දළ ජාතික නිෂ්පාදනය මූර්ත වශයෙන් සියයට 4 කින් පමණ වැඩි විය. මෙය පසුගිය වර්ෂයේ ඇති වූ වර්ධනයේ ප්‍රමාණයට වඩා තරමක් අඩුය. මුදල් වශයෙන් දළ ජාතික නිෂ්පාදිතය පසුගිය වර්ෂයේදීට වඩා වැඩිවී ඇත්තේ සියයට 2.4 කින් පමණකි. මුදල් ආදායම් අතින් 1961 වර්ධනය අඩු වී ඇත්තේ අපනයන අංශයේ ආදායම අඩුවීමත්, ඒ හේතු කොට මුළු අර්ථ ක්‍රමයේ ඇති වූ බලපෑමත් නිසාය.

පිටරටින් ඇරඹෙන උච්චාවචනයනට ලංකාවේ ආර්ථික තත්ත්වය ගෝචර වෙමින් පවතින අන්දම 1961 ලද අත්දැකීම්වලින් පැහැදිලි වෙයි. අපනයන මිල අඩුවීමෙන් රටේ දළ ජාතික නිෂ්පාදිතයේ වර්ධනය අඩු වූවා පමණක් නොව රටේ විදේශීය ගෙවුම් ශෙෂය සහ අය වැය ලේඛන ප්‍රශ්න විසඳීම තවත් අපහසු විය.

මේ කාලය තුළ දී මහ බැංකුවෙන් සහ රජය විසින් පනවන ලද විධිවිධාන අනුව 1961 ලංකාවේ ආර්ථික තත්ත්වය හැඩගැසී ඇති සැටි මේ වාර්තාවේ ප්‍රථම කොටසින් සමීක්ෂණය කැරේ. එසේම වෙනස් වූ ආර්ථික තත්ත්වය ලංකාවේ විදේශීය ගෙවුම් ශෙෂ සම්බන්ධයෙන් බලපෑ අයුරු හා රජයේ මුදල් පරිහරණය හා වෙළෙඳ බැංකු ණය අභ්‍යන්තුර මූල්‍ය තත්ත්වය කෙරෙහි බලපා ඇති අන්දම මෙයින් විග්‍රහ කැරෙයි. මේ කරුණු මිල මට්ටම කෙරෙහි බලපා ඇති අන්දම ද සැසඳේ.

දෙ වැනි කොටසින්, 1961 දී ලංකාවේ ආර්ථික ක්‍රියාකාරිත්වයෙහි සැකැසුම හැඩ ගැසුන අන්දම පිළිබඳ සංඛ්‍යා තොරතුරු සහ කරුණු අනුව කැරුන සවිස්තර විග්‍රහයක් වෙයි. මෙයට ජාතික ආදායම සහ වියදම, විදේශීය වෙළෙඳාම, මිල හා වැටුප්, මුදල් හා බැංකු ගනුදෙනු, රජයේ මුදල් පරිහරණය, ජාත්‍යන්තර ගනුදෙනු ඇතුළත්ය.

## 1-1961 ආර්ථික වර්ධනය

1961 දී ස්ථාවර මිල අනුව ලංකාවේ දළ ජාතික නිෂ්පාදිතයේ වර්ධනය අඩාල වී ඇත. 1960 වර්ධනය සඳහා වූ සංශොධිත ඇස්තමේන්තු අනුව එම වර්ෂයේ දළ ජාතික නිෂ්පාදිතයේ වර්ධනය 1959 ට වඩා සියයට 4·8 කින් වැඩි වී ඇති අතර, 1961 අනුරූප වර්ධනය තාවකාලික ඇස්තමේන්තු අනුව සියයට 2·4 ක් වෙයි. වැඩි වන ජනගහනය සඳහා ඉඩ හැරීමෙන් පසු දළ ජාතික නිෂ්පාදිතයේ සංවර්ධනය ප්‍රතිශීර්ෂ වශයෙන් ගෙන බලන කල 1961 දී සියයට 0·4 කින් අඩු වී ඇත.

ඉහත සඳහන් පරිදි වර්ධනයේ අඩුවීමට හේතු වී ඇත්තේ ලංකා අපනයන සඳහා ලෝක වෙළෙඳ පොළේ ලැබුණ මිල පහළ වැටීමය. මිල වෙනස්වීම අතහැර ගලපා බලන විට ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය සැලකිය යුතු ප්‍රමාණය- කින් වැඩි වී ඇත. මෙසේ 1959 ස්ථාවර මිල අනුව 1961 දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය සියයට 4·2 ක් වී ඇති අතර, ප්‍රතිශීර්ෂ වශයෙන් එය සියයට 1·3 කින් වැඩි වී ඇත. මේ වර්ධනය 1960 සටහන් වී ඇති වර්ධනය වැඩිවීමේ සාමාන්‍යයට අඩු වුවද, ආර්ථික ක්‍රමය මුළුමනින්ම ගෙන බලන විට ද්‍රව්‍යාත්මක නිෂ්පාදිතයෙහි වැඩිවීමෙක් ඇති වෙමින් පවතින බව හෙළි වෙයි.

අපනයන අංශයේ ද්‍රව්‍යාත්මක නිෂ්පාදනය 1960 හා සසඳන විට මූර්ත වශයෙන් සියයට 7·8 කින් වැඩි වී තිබේ. මෙයට ප්‍රධාන වශ යෙන් හේතු වී ඇත්තේ, තේ හා පොල් නිෂ්පාදනය වැඩි වීමය. දේශීය අංශයේ ද්‍රව්‍යාත්මක නිෂ්පාදනය මෙයට අඩු වේගයකින් සියයට 2· 7 කින් වැඩි විය.

1961 වර්ෂයට පෙරතුව වූ වර්ෂවල පාරිභෝජන හා දළ ප්‍රාග්ධන සම්පාදනය සඳහා වූ වියදම දළ ජාතික නිෂ්පාදිතය සෑහෙන ප්‍රමාණයකින් ඉක්මවා ගියේය. මෙසේ කිරීමට හැකි වූයේ විදේශීය සංචිත අඩුකර ගැනීමෙනි. 1961 දී ද පාරි- භෝජනය හා දළ ප්‍රාග්ධන සම්පාදනය සඳහා කැරුන වියදම දළ දේශීය නිෂ්පාදිතය ඉක්මවා ගියද, විදේශීය ගෙවුම් හිඟය අඩුකර ගැනීමෙන් මේ පරතරය බොහෝ දුරට කෙටිකර ගන්නා ලදී.

1961 පාරිභෝජනය හා දළ ප්‍රාග්ධන සම්පාදනයට වැඩි වූ මුළු වියදම් මූර්ත වශයෙන් බලන කල 1960 ප්‍රමාණයට සමානය. එහෙත් පාරිභෝජනය සාමාන්‍ය වශයෙන් අඩුකර ගැනීමෙන් 1961 දී මුළු දළ ප්‍රාග්ධන සම්පාදනය 1960 දීට වඩා සියයට 5·3 කින් වැඩිකර ගැනීමට ලංකාවට හැකි විය. ස්ථාවර වත්කම් අනුව තොගවෙනස් වීම් අත්හැර, දළ ප්‍රාග්ධන සම්පාදනය සියයට 7·8 කින් වැඩි විය. 1961 පාරිභෝජනය පසුගිය අවුරුද්දට වඩා සියයට 0· 8 කින් අඩු විය.

1961 දී වැඩි වූ දළ ප්‍රාග්ධන සම්පාදනය බොහෝ සෙයින් පෞද්ගලික හා රාජ්‍ය අංශය අතර බෙදී ගියේය. 1961 මෙසේ රාජ්‍ය අංශයේ ප්‍රාග්ධන සම්පාදනය සියයට 4· 4 කින් වැඩි වූ අතර, පෞද්ගලික අංශයේ ප්‍රාග්ධන සම්පාදනය, සියයට 5.9 කින් වැඩි විය. එහෙත් තොග වෙනස් වීම් අත්හළ විට මේ හැඩ ගැස්ම සැලකිය යුතු අන්දමින් වෙනස් වෙයි. 1961 දී රාජ්‍ය අංශයේ ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය සියයට 22.3 කින් වැඩි වීඇති අතර, පෞද්ගලික අංශයේ ප්‍රාග්ධන සම්පාදනය සියයට 1·3 කින් අඩු විය. මේ වෙනසට බොහෝ සෙයින් ම හේතු වූයේ, රජයේ ආහාර තොග අඩුවීමත් පෞද්ගලික අංශයේ අපනයන භාණ්ඩ තොග වැඩිවීමත්ය.(1)

## 2-1961 ලංකාවේ විදේශීය ගෙවුම් තත්ත්වය

1957 හා 1960 අතර කාලය තුළ ලංකාවේ විදේශීය වත්කම්වල සමුච්චිත පහළ වැටීමෙක් ඇතිවිය. 1958 දී රුපියල් කෝටි 12·87 කින් ද 1959 දී රුපියල් කෝටි 19 ·92 කින් ද 1960 දී රුපියල් කෝටි 19 ·27 කින් ද විදේශීය වත්කම් පහළ වැටිණි. මෙසේ විදේශීය වත්කම් පහළ වැටීමේ හේතුන් බැංකුවේ පසුගිය වාර්ෂික වාර්තාවෙහි විග්‍රහ කැරිණි. එහි දැක් වූ පරිදි පිට පිටම ඇති වූ අය වැය හිඟයන් නිසා උද්ගත වූ මුදල් ප්‍රසාරණය මේ පහළ වැටීමට ප්‍රධාන හේතුව විය. 1960 අවසාන භාගයේ දී හැර මෙම කාලය මුළුල්ලේම ලංකාව ප්‍රධාන වශයෙන් පිටරට යවන භාණ්ඩවල මිල සහ ලංකාවේ වෙළෙඳ අනුපාතය, පෙරට වඩා ස්ථාවරව පැවැතිණි.

කලින් වර්ෂවල දී මෙන් නොව, 1961 දී ලංකාවේ විදේශීය සංචිත පහළ වැටුනේ රුපියල් කෝටි 0·83 කින් පමණෙකි. 1961 අවුරුද්දේ දී ඇති වූ විශේෂ ලක්ෂණයක් වූයේ පිටරට ගෙවුම් හිඟය පියවා ගන්නා ක්‍රමයේ ඇති වූ වෙනසයි. මේ වර්ෂයේ දී පිටරට ගෙවුම් හිඟය පියවා ගැනීම සඳහා සංචිත අඩු කරනුවා වෙනුවට, පිටරටවලින් ගත් ණයවලින් ගෙවුම් හිඟය පියවන ලදි. මෙසේ 1961 අප්‍රේල් මාසයේ දී ලංකාව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් රුපියල් කෝටි 5 ·38 ක් ලබා ගත්තේය. මෙම මුදල අත්හළ විට විදේශීය සංචිත පහළ වැටීම රුපියල් කෝටි 6·21 ක් වෙයි. මෙය මෙයට පෙරතුව වූ වර්ෂවල පහළ වැටීම්වලට වඩා සැලකිය යුතු ප්‍රමාණයකින් අඩුය.

1961 දී ලංකාවේ ගෙවුම් තත්ත්වය යහපත් වූයේ අපනයන මිල හා මුළු අපනයන ඉපැයුම් පහළ වැටී තිබිය දීය. සියලුම අපනයනයන්ගේ ඒකාබද්ධ මිල දර්ශකය 1960 දී 104 ක් වූ අතර 1961 දී සියයට 8 ·7 කින් අඩු වූයේ 95 ට පහළ වැටිණි. (පාදය 1958 = 100) මේ සංඛ්‍යා එක් එක් වර්ෂයේ සාමාන්‍යය එකට ගෙන ලබා ගත් වාර්ෂික සාමාන්‍යය. අපනයන මිල පහළ වැටීම ඇරඹුනේ 1960 අවසාන භාගයේ ය. එම වර්ෂයේ දී වූ උසස්ම මිල මට්ටම අනුව බලන කල අවසාන භාගයේ දී මිල පහළ වැටීම ඉතාමත්ම සීග්‍ර විය.

ලංකාවේ සැම ප්‍රධාන අපනයන භාණ්ඩයකම මිල පහළ වැටිණි. 1960 දී 130 ක් වූ රබර් මිල දර්ශකය 1961 දී සියයට 19 ·2 කින් අඩු වූයේ 105 ට පහළ වැටිණි. පොල් නිෂ්පාදිත මිල දර්ශකය 103 සිට සියයට 22 ·3 ට අඩු වූයේ 80 තෙක් පහළ වැටිණි. 1960 දී 97 ක් වූ තේ මිල දර්ශකය සියයට 2 කින් අඩු වූයේ 95 කට පහළ වැටිණි.

ලංකාවේ තේ හා පොල් නිෂ්පාදිතයන්ගේ අපනයන ප්‍රමාණය වැඩි නොවූයේ නම් අපනයන භාණ්ඩ මිල පහළ වැටීම නිසා මුළු අපනයන ඉපැයුම් කෙරෙහි ඇති විය හැකි බලපෑම තවත් වැඩි විය හැකිව තිබුණි. 1961 දී පිටරට පැට වූ තේ ප්‍රමාණය රාත්තල් කෝටි 41 ·0 සිට සියයට 3 ·9 කින් වැඩි වූයේ රාත්තල් කෝටි 42 ·6 ට ඉහළ ගියේය. මෙය යුද්ධයෙන් පසුව බොහෝ වර්ෂවලදී පැවැති පිළිවෙළ

(1.) පෙර දී අනුගමනය කළ අන්දමට සහ එක්සත් ජාතීන්ගේ වර්ග කිරීමට අනුව ජාතික ආදායමේ පෞද්ගලික අංශයේ ඇස්තමේන්තුවට සියලුම රජයේ සමායතන ද දුම්රිය හා විදුලිය වැනි රජයේ ව්‍යාපාර ද ඇතුළත් කොට ඇති බව ද සඳහන් කළ යුතුය.

අනුව යාමකි. 1960 දී 109 ක් වූ පොල් නිෂ්පාදිතයන්ගේ අපනයන පරිමා දර්ශකය 1961 දී සියයට 41 කින් 154 ට (මිල මට්ටම පහළ වැටී තිබුණ ද) ඉහළ ගියේය. ප්‍රධාන භාණ්ඩ අතුරින් මිලත් සමග පරිමාව පහළ වැටුනේ රබර් අපනයනයෙහි පමණකි. 1961 දී පිටරට පැට වූ රබර් ප්‍රමාණය සියයට 16 කින් අඩු විය. 1960 දී රාත්තල් කෝටි 23·5 ක් වූ රබර් අපනයනය 1961 දී රාත්තල් කෝටි 19·7 තෙක් පහළ වැටිණි.

එහෙත් ඉහත සඳහන් පරිදි, මුළු අපනයන පරිමාව වැඩි වුවද මිල පහළ වැටී මෙන් ඇති වූ පාඩුව මකාලීමට තරම් එය ප්‍රමාණවත් නොවීය. 1961 දී පිටරට පැටවූ භාණ්ඩ ප්‍රමාණයෙන් වැඩි වුවද, කලින් වර්ෂය හා සසඳන විට ලංකාවේ මුළු අපනයන වටිනාකම රුපියල් කෝටි 9 ·9 කින් පහළ වැටී ඇත. 1960 දී රුපියල් කෝටි 183·2 ක් වූ මෙය 1961 දී 173 ·3 ට පහළ වැටිණි. ලංකාවේ ගෙවුම් ශෙෂයෙහි අසමතුලිත තාවය මකාලීමට උත්සාහ දරන අවදියකදී ඇති වූ මෙම පහළ වැටීම නිසා ගෙවුම් ශේෂය යථා තත්ත්‍වයට ගෙන ඒමේ ප්‍රශ්නය තවත් උග්‍ර විය. පිටරට උද්ගත වන හේතුන් නිසා මිල ගණන්වල ඇති වන අඩුවැඩිවීම් ලංකාව කෙරෙහි දිගටම බලපාන සැටි මෙයින් මනාව පැහැදිලි වෙයි.

1961 අපනයන මිල හා වටිනාකම පහළ වැටීමෙන් ඇති වූ පාඩුවෙන් කොටසක් පමණකි, ආනයන මිල පහළ වැටීමෙන් මකා ගත හැකි වූයේ. 1960 දී 102 ක් වූ ආනයන මිල දර්ශකය 1961 දී සියයට 1·0 කින් 101 තෙක් පහළ වැටිණි. 1961 දී ලංකාවේ වෙළෙඳ අනුපාතය ( ආනයන මිල කෙරෙහි වූ අපනයන මිල අනුපාතය) සියයට 7 · 8 කින් පහළ වැටිණි. 1960 දී 102 ක් වූ වෙළෙඳ අනුපාතය 1961 දී 94 ට පහළ වැටී තිබිණි.

ලංකාවේ විදේශීය ගෙවුම් තත්ත්‍වය යහපත් වීමට ප්‍රධාන කරුණ වූයේ, ආනයන පරිමාව හා වටිනාකම තියුණු ලෙස පහළ වැටීමය. රේගු වාර්තා අනුව 1961 දී ලංකාවේ ආනයන වටිනාකම 1960 දීට වඩා සියයට 13·1 කින් පහළ වැටී ඇත. මුළු ආනයන වටිනාකම අනුව 1960 දී රුපියල් කෝටි 196 ·0 ක් වූ ආනයන 1961දී 170·3 තෙක් අඩු විය. මෙ ා රුපියල් කෝටි 25·7 ක පහළ වැටීමෙකි. ඉහත සඳහන් කළ පරිදි ආනයන වටිනාකම් අඩුවීමට එක්තරා හේතුවක් වූයේ ආනයන මිල අඩුවීමය. මුළු ආනයන වටිනාකම අඩු කිරීමෙහි ලා ආනයන පරිමාවේ අඩු වීමෙන් ඇති වූ බලපෑම ගැන සසඳන විට මිල අඩුවීමෙන් ඇති වූ බල පෑම සුළු වෙයි. මෑත වර්ෂවල දී තියුණු ලෙස ඉහළ ගිය ආනයන පරිමා දර්ශකය 1961 දී 95 ට පහළ වැටිණි. මෙය 1960 දී 113 ක් ද, 1959 දී 116 ක් ද වී තිබිණි. වෙන විධියකින් කියතහොත්, 1961 දී ලංකාව ආනයන කළ භාණ්ඩ ප්‍රමාණය කලින් වර්ෂයේ දීට වඩා සියයට 15.9 කින් පමණ අඩු විය.

ආනයන පරිමාවෙහි ඇති වූ අඩුවීම විවිධ ආනයන වර්ගයන් අතර සමසේ බෙදී ගියේ නොවේ. ආනයන පරිමා දර්ශක අනුව බලන කල ඉතා සීඝ්‍රයෙන් අඩු වී ඇත්තේ පාරිභෝගික ගණයේ භාණ්ඩ ගෙන්වීම ය. මෙය 1960 දීට වඩා සියයට 25.2 කින් පහළ වැටී ඇත. එසේ ම ප්‍රාග්ධන භාණ්ඩ ආනයන පරිමාව සියයට 12.8 කින් අඩු වූ අතර අන්තර් භාණ්ඩ පරිමාව අඩු වී ඇත්තේ සියයට 2.5 කින් පමණකි. පාරිභෝගික භාණ්ඩ ගණයෙහි තියුණුම පහළ වැටීම වූයේ ආහාර පාන හා රෙදිපිළි හැර අනෙකුත් පාරිභෝගික භාණ්ඩ ගණයන්හිය. කලින් වර්ෂය හා සසඳන විට මෙම ගණයෙහි භාණ්ඩ ආනයන පරිමාව සියයට 66·9 කින් පමණ අඩුවී ඇත. ආහාර පාන ගණයෙහි ආනයන පරිමාව සියයට 7.7 කින් ද රෙදි පිළි පරිමාව සියයට 12.8 කින් ද පහළ වැටිණි.

ගත වූ තුන් වර්ෂයෙහි ආනයන මිල හා පරිමා දර්ශකයන්හි වෙනස්වීම් පහත සටහනින් පෙන්නුම් කැරේ.

සංඛ්‍යා සටහන I—1

**ආනයන මිල හා පරිමා දර්ශක**

(පාදය 1958=100)

| | 1959 | | 1960 | | 1961 | |
|---|---|---|---|---|---|---|
| | පරිමාව | මිල | පරිමාව | මිල | පරිමාව | මිල |
| පාරිභෝගික භාණ්ඩ (ඒකාබද්ධ) .. | 112 | 101 | 111 | 101 | 83 | 100 |
| ආහාර පාන .. .. .. .. | 111 | 102 | 104 | 101 | 96 | 99 |
| රෙදි පිළි .. .. .. .. | 89 | 103 | 86 | 108 | 75 | 111 |
| අනෙකුත් පාරිභෝගික භාණ්ඩ .. | 129 | 98 | 148 | 98 | 49 | 96 |
| අන්තර් භාණ්ඩ .. .. .. | 121 | 95 | 121 | 94 | 118 | 89 |
| ආයෝජන භාණ්ඩ .. .. .. | 131 | 111 | 117 | 120 | 102 | 112 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

අපනයන වටිනාකම පහළ වැටුණේ වුව ද, 1961 දී ආනයන වටිනාකම සීඝ්‍ර ලෙස අඩුවීමේ ප්‍රතිඵලයක් වශයෙන් භාණ්ඩ වෙළෙඳ ශේෂයෙහි රුපියල් කෝටි 3.0 ක සාමාන්‍ය අතිරික්තයක් ඇති විය. 1959 දී හා 1960 දී භාණ්ඩ වෙළෙඳ ශේෂයෙහි පිළිවෙලින් රුපියල් කෝටි 25·1 ක හා කෝටි 12.8 ක හිඟයක් ඇති වී තිබිණි.

මෙතෙක් දක්වූ අපනයන ආනයන වටිනාකම් සංඛ්‍යාවන් සහ ඒවායින් ලබාගත් වෙළෙඳ ශේෂයට අදාල වන සංඛ්‍යාවන් නියමිත කාලයක් තුළ මෙරටට ගෙන් වූ හා මෙරටින් යැවූ ද්‍රව්‍යාත්මක භාණ්ඩ පිළිබඳ රේගු වාර්තා පදනම් කොට සකසා ඇත. කෙසේ වුව ද, රටේ ගෙවුම් ශේෂය හා එමගින් විදේශීය වත්කම් මට්ටම කෙරෙහි අපනයනයන්ගේ බලපෑම රඳා පවතින්නේ නියම වශයෙන් පිටරටින් එන ලැබීම් සහ පිටරටට ගෙවන ගෙවීම් මතය. එවැනි ලැබීම් සහ ගෙවීම් පිළිබඳ සංඛ්‍යා විනිමය පාලන වාර්තා වලින් උපුටා ගෙවුම් ශේෂයෙහි වෙළෙඳ ගිණුම්වල දක්වා ඇති අතර, මේ සංඛ්‍යා රේගු වාර්තාවල දක්වා ඇති අපනයන හා ආනයන වටිනාකම් පිළිබඳ සංඛ්‍යා තොරතුරු සමග සැසඳෙන්නේ නොවේ. 110 වැනි පිටුවෙහි පැහැදිලි කොට ඇති පරිදි මෙයට එක්තරා හේතුවක් වී ඇත්තේ කාල නියමයන් හා වර්ග කිරීමේදී ඇතිවන වෙනස් කම් ය. එබැවින් ගෙවුම් ශේෂ වාර්තාවන්හි දක්වා ඇති වෙළෙඳ ගිණුම් ශේෂය, රේගු වාර්තාවල සංඛ්‍යා අනුව ලබාගත් වෙළෙඳ ශේෂය සමග සැසඳෙන්නේ නොවේ.

ගෙවුම් ශේෂයට අනුව 1961 දී වෙළෙඳ භාණ්ඩ ගිණුම් උඩ පිට රටින් ලැබුන ලැබීම් රුපියල් කෝටි 171·97 තෙක් පහළ වැටිණි. මෙය 1960 දී රුපියල් කෝටි 179·6 ක් විය. එහෙත් වෙළෙඳ භාණ්ඩ ගිණුම් උඩ පිටරටට ගෙවූ ප්‍රමාණය මෙයටත් වඩා අඩු විය. 1960 රුපියල් කෝටි 199.88 ක් වූ මෙය 1961 දී කෝටි 178.24 ට සීඝ්‍රයෙන් පහළ වැටිණි. එබැවින් 1961 දී වෙළෙඳ භාණ්ඩ ගිණුමෙහි ඇති වූ ශුද්ධ හිඟය රුපියල් කෝටි 6.27 ක් විය. 1960 දී 20·28 ක් විය. 1960 හා 1961 අතර කාලය තුළ දී වෙළෙඳ හිඟය රුපියල් කෝටි 14·01* කින් අඩු වීමෙන් අපනයන හා ආනයන සම්බන්ධයෙන් ලංකාවේ ගෙවුම් තත්ත්වයෙහි ඇති වූ එක්තරා ප්‍රමාණයක දියුණුවක් හෙළි වේ.

* අපනයන හා සංඛ්‍යා තොරතුරු වාර්තා කිරීමේ ක්‍රමයේ වෙනස්කම් තිබුනේ වුව ද, ගෙවුම් ශේෂයෙහි වෙළෙඳ භාණ්ඩ ගිණුම්හි වෙනස්වීම් හා රේගු වාර්තා අනුව වූ වෙළෙඳ ශේෂයන්හි වෙනස්වීම ද, අතර තරමක කිට්ටු සමානත්වයක් ඇත. එබැවින් 1960 හා 1961 අතර කාලය තුළ දී වෙළෙඳ ශේෂය පහළ වැටීම රුපියල් කෝටි 15·8 කි.

1961 වර්තන ගිණුමෙහි අදෘශ්‍ය ශීර්ෂයන් සඳහා පිටරටට ගෙවන ගෙවීම් තරමක් අඩුකර ගැනීමට ලංකාවට හැකිවිය. එබැවින් සියළුම සේවා ශීර්ෂයන් සඳහා වූ හිඟය 1960 දී රුපියල් කෝටි 3·93 ක් වූවද, 1961 දී එය රුපියල් කෝටි 3·37 ට අඩු විය. මෙම වර්ෂයෙහි ශීර්ෂ අතුරින් විදේශීය සංචාර (නිල ගමන් හා පෞද්ගලික සංචාර හා අධ්‍යයන මුදල් යැවීම් ඇතුළුව එහෙත් ගමන් බඩු සඳහා වියදම් අත්හැර) නිසා 1960 දී රුපියල් කෝටි 2·43 ක හිඟයක් ඇති වූවද, 1961 එය රුපියල් කෝටි 1·77 කට අඩු විය. 1960 දී රුපියල් කෝටි 4·42 ක්වූ ආයෝජන ආදායම් හිඟය 1961 දී රුපියල් කෝටි 4·04 කට අඩු විය. ප්‍රාග්ධන ගිණුමෙහි පෞද්ගලික ප්‍රාග්ධන ඇදී යාම (ශුද්ධ) වැළැක්වීම සඳහා වූ සීමා කිරීම් තවදුරටත් පැවතිණි. කෙටි කාලීන ප්‍රාග්ධනද ඇතුළුව 1961 මෙම ශීර්ෂ යටතට ගැනෙන ප්‍රාග්ධන වලින් පිටරටට ඇදී ගිය ප්‍රමාණය (ශුද්ධ) රුපියල් කෝටි 0·53 ක්වූ අතර, 1961 දී එය රුපියල් කෝටි 0·57 ක් විය. පිටරටට ගෙවන සම්පූර්ණ මුදල් ප්‍රමාණය ගැන සලකන විට මේ ශීර්ෂය යටතේ ගෙවෙන ප්‍රමාණය සුළු නිසාත්, 1961 ට ප්‍රථමයෙන් සිටම මෙසින් ධනය ඇදීයාම වළක්වා ලීමේ සීමාවන් පනවා තුබූන නිසාත් විදේශීය ගෙවීම් අඩු කිරීමෙහිලා මේ ශීර්ෂයට පිහිට විය හැක්කේ මඳ වශයෙනි.

1961 හා කලින් වර්ෂ කිපයක ලංකාවේ මුළු ගෙවුම් ශෙෂ ගිණුමෙහි සාරාංශයක් පහත සටහනින් දැක්වේ.

සංඛ්‍යා සටහන I—2

**1957—1961 ගෙවුම් ශෙෂය**

රුපියල් දශ ලක්ෂ

| | 1957 ශුද්ධ | 1958 ශුද්ධ | 1959 ශුද්ධ | 1960 ශුද්ධ | 1961 තාවකාලිකයි ශුද්ධ |
|---|---|---|---|---|---|
| 1· වෙළෙඳ භාණ්ඩ .. .. | — 95·6 | — 89·6 | —182·9 | —202·8 | — 62·7 |
| 2· සේවා .. .. .. | — 60·1 | — 40·2 | — 13·5 | — 39·3 | — 33·7 |
| 3· පරිත්‍යාග .. . .. | — 39·6 | — 23·1 | — 11·6 | + 21·6 | + 21·0 |
| 4· වර්තන ගිණුම් ශෙෂය .. | —195·3 | —152·9 | —208·0 | —220·5 | — 75·4 |
| 5· පෞද්ගලික ප්‍රාග්ධනය පියවුම් ක්‍රමය .. .. | — 38·4 | — 4·0 | + 1·7 | — 5·3 | — 5·7 |
| 6· රාජ්‍ය හා බැංකු ප්‍රාග්ධන (1) | | | | | |
| (i) විදේශීය වත්කම්හි වෙනස්වීම් .. .. | +213·8 | +128·7 | +199·2 | +192·7 | + 8·3 |
| (ii) ශුද්ධ විදේශීය වගකීම්හි වෙනස්වීම් .. .. | + 19·7 | + 43·8 | + 40·3 | + 3·2 | + 88·0 |
| (iii) අනෙකුත් (2) .. .. | — | — | — 35·7 | — | — 2·3 |
| 7· වැරදීම් හා අත්හැරීම් .. | + 0·2 | — 15·6 | + 2·5 | + 29·9 | — 12·9 |

සංඛ්‍යා ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

(1) එකතු කිරීමේ ලකුණෙන් වත්කම් අඩුවීම හෝ වගකීම් වැඩිවීම හෝ දැක්වේ.

(2) මෙම ශීර්ෂයෙහි සංඛ්‍යාවලින් ලංකාවේ කොටස් ප්‍රමාණය වැඩිවීම නිසා ජා. මූ. අරමුදලට ජා. ප්‍ර. ස. බැංකුවට හා ජා. ස. සංගමයට වැඩිපුර ගෙවන ලද මුදල් දැක්වේ.

සංලක්ෂ්‍යය:–

මෙම වාර්තාවේ ගෙවුම් ශෙෂ විස්තර දැක්වීමේදී ජාත්‍යන්තර සම්ප්‍රදාය අනුව වැදගත් වෙනස්කම් දෙකක් ඇතිකොට තිබේ. පළමුවෙන් වෙළෙඳ භාණ්ඩ අපනයනය හා ආනයනය වාර්තා කිරීම සම්බන්ධයෙන් මෙයට පෙරාතුව ආනයන හා අපනයන වලින් කොටසක් ර. ගැ. මිල අනුව ද, කොටසක් නැ. වි. ස මිල අනුව ද වාර්තා කරන ලදී. එහෙත් මෙහි දැනට අපනයන මුළුමනින් ම නැ. වි. ස. මිල අනුවද, ආනයන ර. ගැ. මිල අනුවද වාර්තා කොට ඇත. දෙවැන්න විදේශීය වත්කම් මෙතෙක් පිටරට පොත් අනුව සැකසුනාද දැනට මෙරට බැංකුවල සහ රජයේ වාර්තා අනුව සැකැස්මේ වෙනස්කම් දෙකම 103 වැනි පිටුවේ විස්තර කැරේ. එසේම සංශොධිත පදනම අනුව අවුරුදු ගණනක සංඛ්‍යා 11 වැනි පරිශිෂ්ටයේ 25 (ඇ) සහ 26 වැනි සංඛ්‍යා සටහන් වලින් දැක්වේ.

විදේශීය සංචිත අඩු කර ගැනීමෙන් හා විදේශීය වගකීම් වැඩි කර ගැනීමෙන් ප්‍රාග්ධන ගිණුමෙහි ඇති වූ මූළු හිඟය (හා පෞද්ගලික ප්‍රාග්ධනයෙහි සුළු වෙනස්වීමක් සමග) කෙතෙක් දුරට පියවා ගත්තේද යන්න ඉහත සඳහන් සංඛ්‍යාවලින් පැහැදිලි වෙයි. කලින් සඳහන් කළ පරිදි 1961 දී වර්තන ගිණුම් හිඟය පිය වූ ආකාරයෙහි වෙනසෙක් ඇති විය. මෙය විදේශීය සංචිත අඩු කැරෙනුවා වෙනුවට විදේශීය වගකීම් වැඩිකර ගැනීමයි. සංඛ්‍යා සටහනින් දක්වෙන පරිදි කලින් වර්ෂවලදී වර්තන ගිණුමේ හිඟය පියවා ගැනීමේ මූළු බරපැට වූනේ ලංකාවේ විදේශීය වත්කම් මතය. 1961 දී වගකීම් රුපියල් කෝටි 8·80 කින් වැඩි වීමට මූලික හේතුව වූයේ එම වර්ෂයේ අප්‍රේල් මාසයේ දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් (1) රුපියල් කෝටි 5.38 ක් ලබා ගැනීමය. අනෙකුත් වගකීම් ජ. ප්‍ර. ස. බැංකුවෙන් ලබාගත් මුදල් වලින් හා අනෙකුත් ණය වලින් ද ලංකාව විසින් ගෙවිය යුතු ගෙවුම් ගිවිසුම් යටතේ වූ ශෙෂ වැඩිවීම් වලින් ද සමන්විත විය. ගෙවීම් ගිවිසුම් යටතේ ලංකාවට ශෙෂවල වෙනස්වම් විදේශීය සංචිතයන්හි වෙනස්වීමට ඇතුළත් කොට ඇත.

මිට ඉහත වර්ෂවල ඇති වූ විදේශීය ගෙවුම් තත්ත්වය අනුව බලන කල 1961 දී ලංකාවේ විදේශීය ගෙවීම් තත්ත්වය දියුණු වී ඇති බව ඉහත ඡේදයන්හි කැරුන විස්තර වලින් පැහැදිලි වෙයි. මෙසේ එක්තරා දියුණුවක් ඇති වූවද, 1961 දී ද ලංකාවේ ගෙවුම් ශෙෂය තවදුරටත් අවාසි සහගතව පැවති බව මෙහිලා සැලකිම වැදගත් වෙයි. ආනයන පරිමාව අඩු කිරීම සඳහා දැඩි උත්සාහයක් දරුවේ වී වූවද, වර්තන ගිණුමෙහි රුපියල් කෝටි 7.54 ක හිඟයක් ඇති විය. අත්‍යාවශ්‍ය හා වඩා අවශ්‍ය නොවන භාණ්ඩ ආනයන අඩු කිරීමත්, සංවර්ධන අවශ්‍යතාවන් වැඩිවීමත් හේතු කොට තව දුරටත් ආනයන කපා හැරීමෙන් ආනයන වියදම අඩුකර ගැනීමට ඇති හැකියාව සීමාවෙයි. එබැවින් අපනයන ඉපැයුම් වැඩිවීම හෝ විදේශීය වගකීම් තවත් වැඩිවීම සිදු නොවූවහොත් ලංකාවේ විදේශීයසංචිත තවදුරටත් දරුණු ලෙස පිරිහීමට ඉඩ ඇත. වෙනත් ලෙසකින් කියන්නේ නම් 1961 දී විදේශීය ශෙෂ තත්වය යහපත් වූව ද, ලංකාවේ විදේශීය ගෙවුම් තත්ත්වය සම්බන්ධයෙන් වඩා ස්ථාවර තාවයක් ඇති කරගත යුතුව තිබේ.

මෙහිදී ලංකාවේ විදේශීය වත්කම් පිළිබඳ තත්ත්වය කෙටියෙන් දක්වීම උචිතය. 1961 අවසානයේදී ලංකාවේ විදේශීය වත්කම් රුපියල් කෝටි 53.3 ක්[2] විය. මෙය වර්ෂයේ ආදායශයය ගෙවීම් ඇතුළුව ආනයන සඳහා කැරුන ගෙවීම් වලින් සියයට 25.8 ක් වෙයි. මෙය කලින් පැවැති වත්කම් ප්‍රමාණය හා සසඳන විට ඉතා අඩු ප්‍රමාණයකි. තවද, අනාගත සංවර්ධන කටයුතු හා අනෙකුත් අවශ්‍යතාවයන් සඳහා විටින් විට භාණ්ඩ ගෙන්වීමට ඇති වන අවශ්‍යතාවයන් හා පිටරට පටවන භාණ්ඩ මිල තවත් පහළ වැටුනහොත් ඉන් ඇති විය හැකි අවාසි සහගත බලපෑම ගැන හා සලකන විට මෙය බොහෝ සෙයින් අඩු ප්‍රමාණයකි. 1960 අවසානයේ දී මහ බැංකු ජාත්‍යන්තර සංචිතය රුපියල් කෝටි 19·02 ක්ව පැවතිණි. 1961 අවසානයේ දී එය රුපියල් කෝටි 18.47 කට අඩු විය. මෙය මූළු විදේශීය වත්කම්වලින් සියයට 34·7 කි 1960 හා සසඳන විට ජාත්‍යන්තර සංචිතයෙහි ද්‍රවශීල සැකැස්මෙහි වැදගත් වෙනසෙක් ඇති නොවිණි. 1961 අවසානයේ දී භාණ්ඩාගාර බිල්පත් හා වට්ටම් කළ බිල්පත් ඇතුළු පිටරට මුදල් ශෙෂ රුපියල් කෝටි 9.22 ක් හෙවත් මූළු සංචිතයෙන් සියයට 49.9 ක් විය. විදේශීය රාජ්‍යවලින් මිලට ගත් සුරැකුම් පත්වල වටිනාකම රුපියල් කෝටි 9.25 ක් හෙවත් මූළු සංචිතයෙන් සියයට 50·1 ක් විය.

---

(1) ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් "මුදල් ලබා ගැනීම" යනුවෙන් හඟින්නේ සාමාජික රටක් එරට මුදල් දී ඒ වෙනුවට විදේශීය මුදල් අරමුදලින් ලබා ගැනීමය. අරමුදලේ ගිවිසුම් වගන්ති අනුව සමාජික රටක් විසින් මෙසෙ අරමුදලට පවරන ලද සිය මුදල් "විදේශීය මුදල්", ලබා ගත් දින සිට අවුරුදු තුනේ සිට පහ තෙක් වූ කාලයක් තුළදී ආපසු මිලදී ගත යුතුය මෙසේ මුදල් ලබා ගැනීම ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හා මුදල් ලබා ගන්නා රටේ උචිත අධිකාරීන් (ලංකාව සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව) අතරේ කැරෙන අවුරුදු තුනේ සිට පහ තෙක් වූ කාලයක් තුළදී ආපසු පැවතිය යුතු, විදේශීය මුදල් ගනුදෙනුවක් වෙයි. 1961 අප්‍රේල් මාසයේ දී මහ බැංකුව විසින් රුපියල් කෝටි 5.38 ක විදේශීය මුදල් මිලට ගැනීම බැංකුවේ ජාත්‍යන්තර සංචිතය ශක්තිමත් කිරීමට උපකාරී විය.

(2) ර. ගැ. මිල සංශොධන කොට ඇති පිළිවෙල 104 පිටුවෙහි දක්වේ.

1960 හා 1961 අවසානයේ ලංකාවේ විදේශීය වගකීම් පිළිබඳ තත්ත්වය පහත දැක්වේ.

සංඛ්‍යා සටහන I—3

**ලංකාවේ විදේශීය වගකීම් (1)**

රුපියල් දශලක්ෂ

| වගකීම් | තොබේරූ ශේෂ 1960 | තොබේරූ ශේෂ 1961 | වෙනස |
|---|---|---|---|
| 1. "ලංකාවෙන් අයවිය යුතු ගෙවුම් ශිවිසුම් ශේෂ .. .. | 0·8 | 22·1 | + 21·3 |
| 2. ජා. මූ. අරමුදලෙන් ලබා ගැනීම් · | — | 53·8 | + 53·8 |
| 3. රන් පවුම් ණය | 167·9 | 167·9 | — |
| 4. ආපසු ලබාගත් හා තොබේරූ අනෙකුත් විදේශීය ණය .. | 129·2 | 148·2 | + 19·0 |
| එකතුව .. .. .. | 297·0 | 392·0 | + 94·1 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි

(1) විදේශීය විනිමය වලින් ගෙවිය යුතු වගකීම්වලට රාජ්‍ය නීති 480 යටතේ ඇති ප්‍රතිපාර්ශ්වීය අරමුදල් සහ වෙළෙඳ බැංකුවල බඩිවාසිකයන්ගේ ශෙෂ ඇතුළත් නොවේ එවැනි ශෙෂ 1961 රු. කෝටි ·60 කින් රු. කෝටි 7·89 සිට, රු. කෝටි 7·29 තෙක් අඩුවිය.

ඉහත සංඛ්‍යාවලින් දැක්වෙන පරිදි 1961 දී අපේ විදේශීය වගකීම් වැඩි වූවද, රටේ සංවර්ධන අවශ්‍යතාවන් අනුව බලන කල තොබේරූ මුළු වගකීම් (විශෙෂයෙන්ම දිගු කාලීන ණයට සම්බන්ධ) සාමාන්‍ය ප්‍රමාණයක වෙයි.

**3 අභ්‍යන්තර මූල්‍ය තත්ත්වය**

ඉහත කොටසින් විස්තර කළ පරිදි ආනයන අඩුවීමටත් ඒ නිසාම 1961 ලංකාවේ විදේශීය ගෙවුම් ශෙෂයෙහි ඇති වූ දියුණුවටත් බොහෝ සෙයින් හේතු වූයේ ආනයන කපා හැරීම සඳහා පනවන ලද විධිවිධානයන්ය. 1960 ලංකාවේ විදේශීය ගෙවුම් තත්ත්වයෙහි ඇති වූ අසමතුලිත තාවයත්, විදේශීය සංචිත පිරිහීයාමත් බරපතල වූ නිසා ඒ සඳහා පිළියම් වශයෙන් දැඩි විධිවිධාන පැනවීම අත්‍යාවශ්‍ය විය. පිටපිටිම ඇති වූ අය වැය හිඟයක් නිසා රට අභ්‍යන්තරයේ ඇති වූ මුදල් ප්‍රමාණයට පිළියම් යෙදීම මෙහි මූලික අවශ්‍යතාවය වූවද, රටේ විදේශීය වත්කම් ආරක්ෂා කර ගැනීම සඳහා ආනයන සීමා කැරීම සඳහා විධිවිධාන පැනවීම වහාම කළ යුතු විය:

ආනයන කෙළින්ම කපා හැරීම සඳහා පනවන ලද විධිවිධාන අනුව භාණ්ඩ විශාල සංඛ්‍යාවක් සඳහා ඇති කළ පරිමා සීමාවන් තවත් දැඩි කරනලදී. එසේම ආනයන තීරුබදු ද වැඩි කැරිණි. එසේම සමහර වර්ගවල භාණ්ඩ ගෙන්වීම සඳහා දෙන බැංකු ණය සීමා කිරීම සඳහා 1960 දී පනවන ලද විධිවිධාන එලෙසම බල පැවැත්වෙමින් තිබිණි. 1961 ආනයන අඩුවීම සඳහා මේ හේතූන් සියල්ලම සහ වෙනත් හේතූන් බලපෑවේ වූවද මේ සඳහා ප්‍රධාන වශයෙන්ම බල පා ඇත්තේ කෙළින්ම පරිමා සීමා කිරීමේ විධිවිධානය·

1961 ජනවාරි මාසයේ දී මින් පෙර සාමාන්‍ය විවෘත බලපත්‍ර යටතට ගැණුන ශීර්ෂ 49 ක් පෞද්ගලික ආනයන බලපත්‍ර යටතට ගනු ලැබීය. අවුරුද්ද තුළ දී තව තවත් ශීර්ෂ මේ සංඛ්‍යාවට එකතු කරනු ලැබීය. මීට අතිරේකව භාණ්ඩ කිහිපයක් ගෙන්වීම සම්පූර්ණයෙන්ම තහනම් කරන ලදී. 1961 ජූලි මාසයේදී

පෞද්ගලික බලපත්‍ර යටතට පත් වූ භාණ්ඩ 31 ක් සඳහා ආනයන පරිමා පංගු පනවනු ලැබීය. අවුරුද්ද තුළ දී අතිකූත් පංගු සඳහා බලපත්‍ර නිකුත් කරනු නො ලැබීය. 1961 දී ආනයන කපා ගැනීමෙහිලා මේ විධිවිධාන නිසැකයෙන්ම විශාල බලපෑමක් ඇති කරන ලදී. උදාහරණයක් වශයෙන් 61 වැනි පිටුවෙහි දක්වා ඇති පරිදි පරිමා සීමා යටතට ගැනුන භාණ්ඩ වලින් ආහාර හා මද්‍යපාන ගණයට ගැනෙන භාණ්ඩ ආනයන 1960 දීට වඩා 1961 දී රුපියල් කෝටි 2·65 කින් අඩු විය. මෝටර් රථ ගෙන්වීම රුපියල් කෝටි 4·51 කින් පහළ වැටුනු අතර, අත්ඔරලෝසු ගෙන්වීම රුපියල් කෝටි 2·85 කින් පහළ වැටිණි. රෙදිපිළි ආනයන ද 1961 දී රුපියල් කෝටි 2·19 කින් අඩු විය මේ පරිමා සීමා කිරීම්වලට අතිරේකව 1961 ජනවාරි හා ජූලි මාසවල දී සීග්‍රයෙන් වැඩි කරන ලද ආනයන බදු ද මුළු ආනයන පරිමාව අඩු කිරීමෙහිලා බොහෝ සෙයින් බලපා ඇත.

කලින් ගෙන්වා තුබූ භාණ්ඩ තොග හා වැඩි වූ මෙරට නිෂ්පාදනය නොවන්නට, ආනයන අඩු වූ හැටියට මෙරට පාරිභෝජනය සඳහා තුබූ භාණ්ඩ ප්‍රමාණය බොහෝ සෙයින්ම අඩුවීමට ඉඩ තිබිණි. කලින් දක් වූ පරිදි වැඩි වශයෙන් අඩු වූයේ පාරිභෝජන භාණ්ඩයන්ය. ආයෝජන හා අතුරු භාණ්ඩ ද මඳ වශයෙන් අඩු විය. මෙවැනි අවස්ථාවක පරිමා සීමා ඇති කිරීමෙන් ආනයන භාණ්ඩ අඩු කිරීම අත්‍යාවශ්‍ය වුවද, එයින් ක්‍රය ශක්තිය හෝ මුදල් ඉල්ලුම හෝ අඩු වන්නේ නොවේ. මේ සමගම මුදල් ප්‍රසාරණයක් දිගටම ඇති වුවහොත් උද්ධමන බලපෑමක් ඇති විය හැකිය. මෙය නොවැළක් වූයේ එය සාමාන්‍ය මිල මට්ටම හා වියදම් මට්ටම කෙරෙහි තරක ලෙස බලපෑ හැකිය.

මීට පෙර වාර්ෂික වාර්තාවෙහි විග්‍රහ කර තිබෙන පරිදි 1961 පෙරාතුවම අවුරුදු වල දී මෙවැනි මුදල් ප්‍රසාරණයක් ඇති වෙමින් තිබිණි. මෙයට ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ රජයේ අය වැය හිඟය වැඩි වීමය. පෞද්ගලික අංශයට අතිරේක ණය දීමද මෙයට මඳ වශයෙන් හේතු විය. මේ හේතූන් නිසා දේශීය මුදල් සැපයුමෙහි ඇති වූ ප්‍රසාරණාත්මක බලපෑම, ආනයන වියදම, ආදායමට වඩා වැඩි වීමෙන් තරමක් මැඩ පවත්වා ගැනීමට හැකි වුවද, එසේ මැඩ පවත්වා ගනු ලැබූයේ රටේ විදේශීය වත්කම් අඩුකර ගැනීමෙනි. එබැවින් ලංකාවේ විදේශීය ගෙවුම් තත්ත්වය යහපත්කර ගැනීමට ඇති අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා යොදන විධිවිධානයනට කෙළින්ම ආනයන කපා හැරීම පමණක් නොව, මූලිකව ඇති මුදල් ප්‍රසාරණය අඩු කර ගැනීමද ඇතුළත් විය යුතුය. ආනයන සඳහා පරිමා සීමා ඇති කිරීමත් සමග ආනයන භාණ්ඩ සැපයුම අඩුවීම නිසා ඇතිවන උද්දමනාත්මක බලපෑම හැකි තරම් අඩු කර ලීම සඳහා මුදල් ප්‍රසාරණය කපා හැරීමේ අවශ්‍යතාවය වඩාත් වැඩි විය.

මේ තත්වය මැඩ පවත්වනු වස් රජය විසින් හා මහ බැංකුව පනවා ඇති විධිවිධානවලට මූල්‍ය අංශයෙහි ඇති ප්‍රසාරණාත්මක හේතූන් අඩු කර ලීමට දැරූ ප්‍රයත්න හා මුළුඉල්ලීම හා ක්‍රය ශක්තිය අධික මට්ටමකට ගැනීම වැළැක්වීමට ගත් ප්‍රයත්නයන් ද ඇතුළත් වෙයි මේ ප්‍රයත්නවලට බොහෝ සෙයින්ම ගැනුනේ රජයේ අය–වැය ලේඛනය නිසා ඇති වන ප්‍රසාරණාත්මක බලපෑම අඩු කර ලීමේ මූල්‍ය විධිවිධාන සහ වෙළෙඳ බැංකුවල ණය ප්‍රමාණය සහ ණය දෙන කරුණු කෙරෙහි බලපාන විධිවිධානයන්ය. මෙම විධිවිධානයන් බලපා ඇති අයුරු හා ඒවා මෙවැනි අවස්ථාවක දී කෙතෙක් දුරට ඵලදායී වී ඇද්ද යන්න මීලඟ කොටසින් විස්තර කැරේ.

### (අ) රජයේ මුදල් පරිහරණයේ ප්‍රසාරණාත්මක බලපෑම

රජයේ අය – වැය කටයුතු, ඔක්තෝබර් 1 වැනිදයින් පටන් ගෙන සැප්තැම්බර් 30 වැනිදයින් අවසන් වන මුදල් වර්ෂය අනුව සලකා බැලීම පහසුය. 1961 ලිත් වර්ෂය, 1960 – 61 මුදල් වර්ෂයටත් වර්තමාන මුදල් වර්ෂයවූ 1961 – 62 ත් අතර ගැනෙයි. අය - වැය කටයුතු පිළිබඳ නියම තොරතුරු දැන ගත හැක්කේ 1961 මුල් නව මාසය ඇතුළත් වන 1960 – 61 පිළිබඳව පමණෙකි. 1960-1962 වර්තමාන වර්ෂ විග්‍රහ කිරීමෙහිලා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කැරුන අය වැය ඇස්තමේන්තු පදනම් කරගත හැකිය.

1960 – 61 ට පෙරාතුව මුදල් වර්ෂ දෙකෙහි එක් එක් වර්ෂය සඳහාවූ රජයේ මුළු අය වැය හිඟය රුපියල් කෝටි 40·0 ට තරමක් වැඩි විය. 1959–60 දී මුළු අය-වැය හිඟය රුපියල් කෝටි 41· 75 ක් විය. මෙයින් රුපියල් කෝටි 25· 11 ක් ලබා ගන්නා ලද්දේ ප්‍රසාරණාත්මක මාර්ගයන් වන බැංකු ක්‍රමයෙන් ණයට ගැණීමෙනි. එම අවුරුද්දේ සම්මත කළ මුළු අය වැය ප්‍රමාණය රුපියල් කෝටි 182·00* ක් වූ අතර මුළු ආදායම රුපියල් කෝටි 140·38 ක් විය. මේ සංඛ්‍යා වලින් අය වැය හිඟය පියවා ගැනීමේ කාර්යයෙහි ඇති බරපතලකම හා වියදම අඩු කිරීමෙන් හෝ සීමා කිරීමෙන් හෝ ආදායම වැඩි කිරීමෙන් සහ අනෙකුත් ප්‍රසාරණයක් ඇති නොවන මාර්ගයන්ගෙන් අය වැය හිඟය පියවීමෙන් ඇති විය හැකි ප්‍රසාරණය හෙළි වේ. ප්‍රසාරණ බලපෑම අඩුකරලීමේ පරමාර්ථය ක්‍රියාත්මක කැරුනේ සැලසුම් කර ඇති ඉලක්කයට අඩුවෙන් වැඩි වෙමින් ඇති සංවර්ධන ක්‍රම සඳහා වැඩි වැඩියෙන් වියදම් කිරීමේ අවශ්‍යතාවය හා අර්ථ ක්‍රමයේ ක්‍රියා ශීලිත්වය වර්ධනය කිරීමේ අවශ්‍යතාවය ද උද්ගත වී තුබූ අවදියකය.

**1960 – 61 අය වැය - ලේඛනය - ඇස්තමේන්තු**

පාර්ලිමේන්තුවෙන් සම්මත වූ 1960 – 61 අය වැය ලේඛනයේ මුළු වියදම 1959 - 60 අය වැය ලේඛනයේ නියම වියදම් වලට වඩා රුපියල් කෝටි 14· 00 කින් වැඩි කරන ලදී. එසේ වුවද, එම අය වැය ලේඛනයෙන් මුළු අය වැය හිඟය අඩු කොට, ප්‍රසාරණ මාර්ග වලින් මුදල් ලබා ගැනීමේ අවශ්‍යතාව සම්පූර්ණයෙන් ම වාගේ නැති කිරීමට අදහස් කොට තිබිණි.

රජයේ මුදල් පරිහරණ කටයුතුවල ප්‍රසාරණ බලපෑම 1960 – 61 අය වැයෙන් මැඩ පැවැත්වීමට අදහස් කරන ලද්දේ ආදායම් අංශය වැඩි කිරීමෙහිලා ප්‍රමාණවත් ලෙස උත්සාහ දැරීමෙන් හා බැංකු වලින් නොවන මාර්ග වලින් හා විදේශාධාර මගින් මුදල් සපයා ගැනීමෙනුත්ය. ආදායම් වැඩ පිළිවෙලින් 1959 - 60 රුපියල් කෝටි 140· 4 ක්ව තුබූ ආදායම 1960- 61 දී රුපියල් කෝටි 163·4 තෙක් වැඩි කිරීමට අදහස් කරන ලදී. මෙය එක් අවුරුද්දක් තුළ දීරුපියල්කෝටි 23·0 කින් හෝ සියයට 16 කින් වැඩි වීමකි. දේශීය ණය ගැණීම් වලින් රුපියල් කෝටි 24· 0 ක් අපේක්ෂා කරන ලදී. මෙය 1959 – 60 බැංකු නොවන මාර්ගවලින් නියම වශයෙන් ලබාගත් රුපියල් කෝටි 14 ·12 ක මුදලට වඩා රුපියල් කෝටි 9·88 කින් වැඩිය. මේ සමග විදේශාධාර වලින් මේ අවුරුද්දේ රුපියල් කෝටි 10·0 ක් ලැබේ යයි ඇස්තමේන්තු කරන ලදී. එහෙත් 1959 – 60 මේ මාර්ගයෙන් ලැබුන මුදල රුපියල් කෝටි 3·86 කි.

රුපියල් කෝටි 23· 0 කින් වැඩි වෙතැයි අපේක්ෂිත ආදායමෙන් රුපියල් කෝටි 10·7 ක් වැඩි කරන ලද අපනයන බදු, ආදායම් බදු, පෞද්ගලික බදු වලින් ද, 1960 තියුණු ලෙස වැඩි වූ ආනයන බදු වලින් ද ලබා ගැනීමට බලාපොරොත්තු විය. වැඩි වූ ආදායමෙන් රුපියල් කෝටි 12·3 ක් 1960 – 61 අය වැය ලේඛනයෙන් පනවන ලද, අළුත් බදු වලින් ලැබේ යයි අපේක්ෂා කරන ලදී. ආදායම් බදු කෙරෙහි පනවන ලද, අධි බද්දෙන් රුපියල් කෝටි 3·0 ක්ද අතිරේකව පනවන ලද ඉඩම් බද්දෙන් රුපියල් කෝටි 1·5 ක් ද ව්‍යාපාර නාම ලියා පදිංචි කිරීමේ බද්දෙන් කෝටි 5·0 ක් ද, කොටස් ප්‍රාග්ධන බද්දෙන් රුපියල් කෝටි 1·0 ක් ද වෘත්තීය බද්දෙන් රුපියල් කෝටි ·3 ක් ද වීසා බද්දෙන් රුපියල් කෝටි 1·5 ක් ද ලැබේ යැයි ඇස්තමේන්තු කරන ලදී. මේ ඇස්තමේන්තු මගින් ලබාගැනීමට බලාපොරොත්තු වන මුළු ආදායම් ප්‍රමාණය, අලුත්බදු වලින් ලබාගැනීමට බලාපොරොත්තු වන වැඩිම ප්‍රමාණයයි.

---

* මෙයට අත්තිකාරම් ගිණුම් කටයුතුවල ශුඩ ගෙවීම් ප්‍රමාණය වූ රුපියල් ·13 කෝටිය ද නිදන් අරමුදල් දීමනා ද, මහ බැංකුවෙන්, විශේෂ ණයක් ගෙන ගෙවූ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි රුපියල් කෝටි 3.70 ක දායක දීමනාව ද ඇතුළත් නොවේ.

ඉහත විස්තර කළ විධිවිධානයන්ගේ ඒකාබද්ධ ප්‍රතිඵලය වශයෙන් 1959 60 තෙක් රුපියල් කෝටි 45·1* ක් ව පැවති මුළු අය වැය හිඟය 1960 – 61 රුපියල් කෝටි 34·0 අඩු කිරීමට ඇස්තමේන්තු කැරිණි. 1959 – 60 හිඟය ගෙවීමේ ප්‍රසාරණාත්මක බලපෑම රුපියල් කෝටි 25·7 ක්වූ අතර, 1960 – 61 දී ප්‍රසාරණාත්මක මාර්ගවල පිහිට නොසොයා මුළු හිඟය, විදේශීය ණය ගැනීම්වලින් පියවා ගැනීමට අදහස් කරන ලදි. 1961 ජනවාරි මාසයේ දී අය වැය ලේඛනය ඉදිරිපත් කිරීමෙන් පසු බොහෝ වර්ගවල ආනයන සඳහා සියයට 5 ක අධි බද්දක් පැනවීමෙන් සහ මුළු වර්තන වියදම සියයට 10 කින් කපා හැරීමෙන් අය වැය ජේවය තවත් ශක්තිමත් කරන ලදී.

**1960 – 61 අය වැය ලේඛනය (නිමාව)**

කෙසේ වුවද, අවසානයේ දී 1960 – 61 අය වැයෙහි පූර්ණ ප්‍රතිඵල සලකා බලන විට එය යටකී අපේක්ෂාවනට හා ඇස්තමේන්තුවලට බොහෝ වෙනස් වී ඇත.

1960 – 61 අය වැය හිඟය රුපියල් කෝටි 45· 43 ක් විය. මෙයින් රුපියල් කෝටි 24·14 ක් ලබාගන්නා ලද්දේ ප්‍රසාරණ මාර්ග වන බැංකු ක්‍රමයෙන් ලද දේශීය ණය ගැනීම් වලිනි. එක්සත් ජනපද ආධාර ප්‍රතිපාර්ශ්වීය අරමුදල් සඳහා වැඩි වූ රුපියල් කෝටි 0·75 හැරුණු විට, අයවැයෙහි ශුද්ධ ප්‍රසාරණ බලපෑම රුපියල් කෝටි 23·39 ක් විය. මෙම සංඛ්‍යා 1959 – 60 අය වැයෙහි මුළු අය වැය හිඟය වූ රුපියල් කෝටි 41·75 ක් හා රුපියල් කෝටි 25·11 ක ශුද්ධ ප්‍රසාරණ බලපෑම හා සැසඳේ. අවසාන වශයෙන් සලකන විට, 1960 – 61 අය වැයෙන් මුළු ප්‍රසාරණ බලපෑම කලින් අවුරුද්දේ බලපෑමට වඩා සැලකිය යුතු අන්දමින් වෙනස් වී නොමැති බව මෙයින් පෙනී යයි.

අය වැය ලේඛනයෙහි අවසන් ප්‍රතිඵල අතරින් මුල් ඇස්තමේන්තු අතර වෙනස්කම් වලට හේතු වූ කරුණු කිහිපයෙක් වෙයි. මුළු වියදම් ඇස්තමේන්තුවද, පුළුල් වශයෙන් වෙනසෙක් නොවීය. එබැවින් නියම මුළු වියදම රුපියල් කෝටි 196·82 ක් විය. මෙය මුල් ඇස්තමේන්තුවලට වැඩි වන්නේ රුපියල් කෝටි 0·81 කින් පමණකි. මෙය පසුගිය අවුරුදුවල ලද අත්දැකීම්වලින් වෙනස් වෙයි. එකල මුළු වියදම් මුල් ඇස්තමේන්තුවලට වඩා නිත්‍ය වශයෙන්ම වැඩි වූ අතර, එය මුළු අය වැය හිඟයක් පිළිබඳව අපේක්ෂාවන් හා ප්‍රතිඵල අතර ඇති වූ වෙනස්කම් වලට ප්‍රධාන හේතුව විය. කෙසේ වුව ද, කලින් සඳහන් කළ පරිදි 1960 – 61 දී මුළු වියදම් ඇස්තමේන්තු කලින් වර්ෂවල දිට වඩා වැඩි විය.

ඇස්තමේන්තු හා ප්‍රතිඵල අතර සැලකිය යුතු වෙනසක් ඇති වූයේ මුදල් ලබා ගැනීමේ මාර්ගවලය. මුදල් ලබාගැනීමේ මාර්ගයන්හි වෙනස්කම් ඇති වූයේ ආදායමේ එකතුවීම හා විදේශීය ආධාර ණය ගැනීම සම්බන්ධයෙනි 1960–61 ලද මුළු ආදායම රුපියල් කෝටි 151· 33ක් විය. මෙය එම අවුරුද්දේ මුල් ඇස්තමේන්තුවලට වඩා රුපියල් කෝටි 12·0කින් අඩුය. 1960 – 61 දී ලද විදේශාධාර ප්‍රමාණය රුපියල් කෝටි 2· 96 කි මෙය ඇස්තමේන්තු කළ රුපියල් කෝටි 10· 0 කට වඩා රුපියල් කෝටි 8· 37 කින් අඩුය. මෙයට අමතරව, බැංකු නොවන දේශීය මාර්ගයන්ගෙන් ලබා ගැනීමට ඇස්තමේන්තු කළ ණය ප්‍රමාණයෙන් ද අඩුවෙක් වී 1960 – 61** දී මේ මාර්ගයෙන් ණයට ගත් ප්‍රමාණය රුපියල් කෝටි 19·9 ක් වූ අතර, ඇස්තමේන්තු කළ ප්‍රමාණය රුපියල් කෝටි 24· 0 ක් විය.

---

* ශුද්ධ අය වැය හිඟයට, නිදන් අරමුදල් දීමනා ඇතුළත් නොවන බැවින්, එය දළ අය වැය හිඟයට එපමණින් වෙනස් වෙයි ඉහත සඳහන් කළ පරිදි 1959 – 60 ශුද්ධ අය - වැය හිඟය රුපියල් කෝටි 41 7 ක් විය.

** සාමාන්‍යයෙන් වෙළෙඳ පොළේ ආයෝජන කරන කාර්යාල අරමුදල් වලින් භාණ්ඩාගාරය කෙළින්ම ලබාගත් ණය ඇතුළත් ය

1960 – 61 දී ලද ආදායම, ඇස්තමේන්තු කළ ආදායමට වඩා අඩු වුවද, ගත වූ අවුරුද්දේ ලද ආදායමට වඩා සැලකිය යුතු ප්‍රමාණයකින් වැඩි විය. අපනයන මිල අඩු වුවද, රජයේ ආදායම 1959 – 60 මට්ටමට වඩා රුපියල් කෝටි 11· 0 කින් වැඩි විය. මෙයින් 1960 – 61 දී බදු පැනවීමෙන් ආදායම් ලබා ගැනීමට කළ අධිකතර උත්සාහය හෙළිවේ. විශාල වැය පරිමාවක් තිබිය දී, මුළු අය වැය හිඟය අඩු කිරීමට අදහස් කරන අය වැය සැලසුමක ඇස්තමේන්තුවලට වඩා ආදායම අඩුවීම අවශ්‍යයෙන් ම සැලකිය යුතු කරුණක් වෙයි.

1960 – 61 මුළු ආදායම් එකතු කිරීම අඩු වූ මාගී ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට බෙදේ. එනම් අපනයන බදු ආදායම් හා එම අවුරුද්දේ පනවන ලද අළුත් බදු ආදායම්ය. ආනයන බද්ද ආදායම් බද්ද හා අධි ආදායම් බද්ද යනාදියෙන් ලද ආදායම ඇස්තමේන්තුවලට සමාන වූවා පමණක් නොව, සමහර අවස්ථාවලදී මුල් ඇස්තමේන්තුවලට වඩා වැඩි විය. අධි බද්ද ඇතුලුව ආදායම් බද්දෙන් ලද මුදල ඇස්තමේන්තුවට වඩා රුපියල් කෝටි 2 ·48 කින් වැඩි වූ අතර, ගත වූ අවුරුද්දේ ලද මුදලට වඩා රුපියල් කෝටි 4·03 කින් වැඩි විය. මෙයින් පෞද්ගලික අංශයේ වැඩි ආදායම් මට්ටම පිළිබිඹු කරයි. පෞද්ගලික බද්දෙන් ලද ආදායම (වියදම් හා ත්‍යාග බදු) රුපියල් කෝටි 1·18 ක් වූ අතර, එය මුල් ඇස්තමේන්තු වූ රුපියල් කෝටි 1.9 යට වඩා අඩු වෙයි. එසේ වුවද, 1959 – 60 ලද ප්‍රමාණයට වඩා මේ මුදල ද, රුපියල් කෝටි 0·12 කින් වැඩි ය.

ඇස්තමේන්තු කළ මුදලට වඩා අපනයන ආදායමේ අඩුවීමට ප්‍රධාන හේතුව වූයේ රබර් අපනයන බදු වලින් ලද මුදල, ඇස්තමේන්තුවලට වඩා රුපියල් කෝටි 3· 36 කින් අඩු වීමය. මෙය 1960 නොවැම්බර් 1961 පෙබරවාරි යන මාසවලදී බදු ප්‍රමාණය රාත්තලකට සත =/8 කින් හා සත /=10 කින් දෙවරක්ම අඩු කිරීම හා කලින් දක් වූ පරිදි පිටරට යැවූ රබර් ප්‍රමාණය අඩු වූ නිසා සිදුවූවකි. ඇස්තමේන්තු අනුව සලකා බලන විට පොල් සඳහා වූ බදු වලින් ලද ආදායම් ද මඳ වශයෙන් රුපියල් කෝටි 0·32 කින් අඩු විය. එහෙත් 1961 මැයි මාසයේ දී බදු අඩු කිරීමෙන් වූ පාඩුව පිටරට පැට වූ ප්‍රමාණය බොහෝ සෙයින් වැඩිවීමෙන් මැකී ගියේය.

අපෙක්ෂිත ආදායම වැඩි වශයෙන්ම නොලැබී ගියේ අළුත් බදු වලින් ලැබේ යැයි ඇස්තමේන්තු කළ ආදායම් සම්බන්ධයෙනි. අධි ආදායම් බද්දෙන් ලද රුපියල් කෝටි 2.89 ක ආදායම මුල් ඇස්තමේන්තුවලට දළ වශයෙන් සමාන වෙයි එහෙත් අනෙක් බදු වලින් අපේක්ෂිත ප්‍රමාණය රුපියල් කෝටි 9.3 ක් වුව ද, ලැබුනේ රුපියල් කෝටි 1 71 ක් පමණෙකි අළුත් බදු වලින් විශාලම ශීර්ෂය වූ ව්‍යාපාර ලියා පදිංචි කිරීමේ බද්දෙන් රුපියල් කෝටි 5.0 ක් ලැබෙනැයි ඇස්තමේන්තු කළ ද ලැබුනේ රුපියල් කෝටි 0·33 ක් පමණෙකි. අළුත් බදු ලැබූ ප්‍රමාණය නිවැරදි ලෙස ඇස්තමේන්තු කිරීම පිළිබඳව පැන නගින දුෂ්කරතාවලට අතිරේකව, බදු එකතු කිරීම සඳහා බාධක ඇති වූයේ ව්‍යවස්ථා සම්පාදනය පමා වූ බැවිනි. සාමාන්‍යයෙන් ජූලි මාසයේදී ඉදිරිපත් කරන අයවැය ලේඛනය අලුත් ආණ්ඩුව ජූලි මස අවසාන යේදී පිහිට වූ නිසා සැප්තැම්බර් මස තෙක් පමා විය. මීට අතිරේකව අළුත් බදු පිළිබඳව සමහර ව්‍යවස්ථා සම්පාදනය මුදල් වර්ෂයේ අවසාන භාගය තෙක්ම අවසන් කළ නොහැකි විය.

පහත දක්වෙන සටහනින් 1960-61 බදුවලින් ලද ලද ආදායම්හි වෙනස් වීම් එම අවුරුද්දේ ඇස්තමේන්තු සමඟ ද, 1959-60 ලද නියම ආදායම සමඟ ද සැසඳිය හැකිසේ දක්වා ඇත. මෙම බදු වලින් ලද ආදායම්හි සාපෙක්ෂක එකතුව 11-41 සංඛ්‍යා සටහනින් දක්වේ.

## සංඛ්‍යා සටහන I—4

## ආදායමෙහි අධිකයන් (+) හා අඩුවීම (—)

රුපියල් දශලක්ෂ

| | ඇස්තමේන්තු කළ වැඩිවීම 1959-60ට වඩා 1960-61 | නියම වැඩිවීම 1959-60 වඩා 1960 - 61 | 1960-61 ඇස්තමේන්තු අනුව අධිකය (+) හෝ අඩුව (−) |
|---|---|---|---|
| 1. අපනයන බදු(තේ බද්ද ඇතුළුව) . | +10·5 | —23·7 | — 34·1 |
| 2. ආනයන බදු .. .. .. .. | +24·4 | +28·8 | + 4·4 |
| 3. ආදායම් බද්ද (අධි බද්දහැර) .. | +15·5 | +40·4 | + 24·9 |
| 4. පෞද්ගලික බද්ද .. .. .. | +17·8 | +10·6 | — 7·2 |
| 5. 1960-61 අය-වැය ලේඛනයෙන් පැන වූ අළුත් බදු | | | |
| (අ) ආදායම් බදු වලින්වූ අධි භාරය .. | +30·0 | +28·9 | — 1·1 |
| (ආ) අළුත් බදු .. .. .. | +93·1 | +17·0 | — 76·1 |
| (ඇ) අනෙකුත් ආදායම් ශීර්ෂ .. | +38·8 | + 8·1 | — 30·8 |
| එකතුව .. .. .. | +230·1 | +110·1 | —120·0 |

ඉහත දැක්වූ කරුණු සලකා බැලීමෙන් උද්ගත වන මූළු තත්වය ලුහුඬින් දැක්විය හැකිය. 1960 – 61 අය වැය ලේඛනයෙන් 1959 – 60 ආදායමට වඩා ආදායම රුපියල් කෝටි 23· 0 කින් වැඩි කිරීමට අදහස් කරන ලදී මෙයින් සියයට 46 ක්, දැනට පවත්නා බදු ක්‍රමයෙන් ද සියයට 13 ක් අධි ආදායම් බද්දෙන් ද සියයට 41 ක් බදු වලින් ද ලබා ගැනීමට අදහස් කරන ලදී. අවසාන වශයෙන් 1960 – 61 දී ආදායම රුපියල් කෝටි 11· 0 කින් වැඩි විය. මෙයින් සියයට 59 ක් තහවුරු වූ ආදායම් මාර්ගවලින් ද, සියයට 26 ක් අධි භාරයෙන් ද සියයට 15 ක් පළමු වරට පැනවූ අළුත් බදු මගින් ද ලැබී ඇත. මේ සංඛ්‍යා වලින් අපේක්ෂා හා ප්‍රතිඵල අතර ඇති වූ වෙනස හා අළුත් බදු සම්බන්ධයෙන් ලැබෙන ආදායම නිවැරදිව ඇස්තමේන්තු කිරීමේ දී ඇති වන දුෂ්කරතා විස්තර කැරේ.

1960 – 61 අය – වැය ලේඛනය නියම වශයෙන් තීරණය කිරීමෙහිලා බලපා ඇති අනෙක් වැදගත් කාරණ නම් බලාපොරොත්තු වූ විදේශීය ආධාර හා ණය ප්‍රමාණය රුපියල් කෝටි 8. 37 කින් අඩු වීමය. මෑත වර්ෂවල අය වැය ලේඛනය ප්‍රථම වරට ඉදිරිපත් කිරීමේ දී මුළු අය වැය හිඟය පියවීම සඳහා අවධමන ආදායම් මාර්ගයක් ලෙස සැලකෙන විදේශීය ආධාර හා ණය ගැනීම් වලින් සැලකිය යුතු මුදලක් ලබා ගැනීමට විධිවිධාන සලසා තිබිණි. මේ මාර්ගයෙන් ලබාගැනීමට මුලදී බලාපොරොත්තු වූ ප්‍රමාණය සැලකිය යුතු ප්‍රමාණයකින් අඩුවන්නට වී ඇත.

මේ අඩුවට හේතු වූ වැදගත් කරුණක් විය හැක්කේ, මුල දී ගිවිස ගත් ප්‍රමාණයම මුල් ඇස්තමේන්තු සැලැසීම සඳහා පදනම් කර ගැනීම විය හැකිය. විදේශීය ණය වශයෙන් හා ආධාර වශයෙන් ගිවිසගත් මුදල් යම්කිසි නියමිත යෝජනා ක්‍රමයක් සඳහා වන්නේ නම් ඒ ඒ වර්ෂය තුළ දීම නොලැබෙන්නට ඉඩ තිබේ. මෙයට හේතු වන්නේ ඒ නියම වශයෙන් ක්‍රියාත්මක කිරීම පමාවන නිසාත්, නියම වියදම් ඇස්තමේන්තුවලට වඩා අඩුවන නිසාත්ය. ඉහතකී පමාවීම් නිසා වැය පක්ෂයෙහි ඉතිරි වීමෙක් ඇති විය හැකි වුවද, අනෙකුත් අංශයන්හි වියදම් වැඩිවීම නිසා ඒ බොහෝ විට මැකී යයි. මෙහිලා සැලකිය යුතු තවත් කරුණෙකි. රාජ්‍ය නීති 480 ප්‍රතිපාර්ශ්වීය අරමුදල් වලින් ගන්නා ණය හා ආධාර රජයේ වියදම් පියවා ගැනීමේ මාර්ගයක් වුවද, ලබා ගත් විදේශීය විනිමය සඳහා ඒ හිලව් නොවන නිසා එයින් ද ප්‍රසාරණාත්මක බලපෑමක් ඇති කරයි. රාජ්‍ය නීති 480 යටතේ කැරුණ ගනුදෙනු නිසා විදේශීය විනිමය ඉතිරි වනුයේ තිරිඟු සඳහා රුපියල් වලින් ගෙවන මුල් අවස්ථාවේ දීය. එබැවින් අය-වැය හිඟයෙහි ප්‍රසාරණාත්මක බලපෑම අඩු වන්නේ නොවේ.

මේ කරුණු සහ ඉහත සඳහන් කරුණු සැලකිල්ලට ගන්නාවිට, රජයේ අය වැය ලේඛනයට ඇතුළත් කැරෙන විදේශීය ආධාර හා ණය සම්බන්ධයෙන් දැනට වඩා දූඩි අය වැය ප්‍රතිපත්තියක් අනුගමනය කළ යුතුය. මෙය වඩාත් වැදගත් වනුයේ පුළුල් වී යන සංවර්ධන සැලැසුමෙහි විදේශීය ආධාර හා ණය ගැනීම් වල වැදගත් කම වඩාත් වැඩි වී ඇති බැවිනි.

කලින් සඳහන් කළ පරිදි ආදයම හා විදේශීය ආධාර අඩුවීමෙහි ප්‍රතිඵලය වූයේ 1961 දී ඇති වූ අය-වැය හිඟය (දළ) රුපියල් කෝටි 48·9 ක් වීමය. එසේම අයවැය හිඟය පියවා ගැනීම සඳහා ප්‍රසාරණාත්මක මාර්ගයන්ගෙන් ගත් ප්‍රමාණය රුපියල් කෝටි 23. 39 ක් විය. 1959-60 හා 1960-61 හිඟය පියවූ ක්‍රමයෙහි සංසන්දනාත්මක සාරාංශය දක්වෙන පහත සටහනින් මෙය පෙනී යයි.

## සංඛ්‍යා සටහන I—5

## හිඟය පියවීම

රුපියල් දශලක්ෂ

| | 1959-60 | 1960 61 |
|---|---|---|
| 1. බැංකු නොවන මාර්ගයන්ගෙන්* | | |
| (අ) පරිපාලන ණය ගැනීම් .. .. .. | 11·4 | 32·5 |
| (ආ) බැංකු නොවන මාර්ගයන්ගෙන් | | |
| ලබාගත් දේශීය ණය .. .. .. | 163 | 199 |
| (ඇ) විදේශීය ණය ගැනීම් .. .. .. | 29·3 | 16·3 |
| 2. බැංකු ක්‍රමයෙන් ලබා ගත් දේශීය ණය .. .. | 241·1 | 241·4 |
| 3. රජයේ මුදල් ශෙෂ වලින් .. .. .. .. | 6·0 | — |
| 4 දළ අයවැය හිඟය .. .. .. .. .. | 451 | 489 |
| 5. එ. ජ. ප්‍රතිපාර්ශ්වීය අරමුදල් ගිණුමේ | | |
| වෙනස සඳහා ගැලපිලි .. .. .. .. | 4·0 | 7·5 |
| 6. අයවැය ලේඛනයේ ශුඩ ප්‍රසාරණ | | |
| බලපෑම (2 3 හා 5 යන ශීර්ෂ) .. .. | 251·1 | 233·3 |

සංලක්ෂ්‍යය:- *සාමාන්‍යයෙන් වෙළෙඳ පොළේ ආයෝජන කැරෙන රාජ්‍ය නියෝජ්‍යත්ව යන්ගේ අරමුදල් භාණ්ඩාගාරය විසින් කෙළින්ම ණයට ගණු ලැබීමෙන් පසු ඒ ගැලපූ අයුරු

ඉහත සංඛ්‍යාවලින් දක්වෙන පරිදි 1960 - 61 දී බැංකු නොවන මාර්ගයන්ගෙන් ගත් ණය පසුගිය වර්ෂවල දීට වඩා රුපියල් කෝටි3·6 කින් වැඩි වූවද බැංකු වලින් ණය නොගෙන අය වැය හිඟය පියවීමට එය ප්‍රමාණවත් නොවීය. මෑත වර්ෂවල දී බැංකු ක්‍රමයෙන් ගත් ණය ප්‍රධාන වශයෙන් ගෙන ඇත්තේ මහ බැංකුවෙනි. 1960 - 61 මහ බැංකුවෙන් ගත් ණය ප්‍රමාණය රුපියල් කෝටි 20·56 ක් විය. මේ සමගම පෙර අවුරුදු වලදී වෙළෙඳ බැංකු වලින් රජයට දුන් ණය ප්‍රමාණය එතරම් සැලකිය යුතු නොවූවද 1961 දී ණය රුපියල් කෝටි 3·71 ක් විය,

මෑත වර්ෂවල දී රජයට ණය ගැනීම් ක්‍රමයක් වශයෙන් භාණ්ඩාගාර බිල්පත්වලට හිමි වී ඇති වැදගත්කම 1961 අවසානය වන විට නොබේරා ඇති භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය රුපියල් කෝටි 75.0 ක් වීමෙන් පෙනී යයි. එදිනට මහ බැංකුව සතුව තිබූ භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය රුපියල් කෝටි 68·06 ක් විය. 1961 ජූනි මාසයේ දී පාර්ලිමේන්තු යෝජනා සම්මුතියකින් භාණ්ඩාගාර බිල්පත් මගින් ලබාගත හැකි ප්‍රමාණය රුපියල් කෝටි 65.0 සිට කෝටි 75.0 දක්වා වැඩි කැරිණි.

## 1961 – 62 අය වැය ලේඛනය

මෙතෙක් සාකච්ඡා කැරුණේ1960–61 අය වැය ලේඛනය සම්බන්ධයෙනි. එසේ වුවද, ඉහත සඳහන් පරිදි 1961 ලිත් වර්ෂයේ අවසාන කාර්තුව 1961 – 62 මුදල් වර්ෂයට ඇතුළත් වෙයි. මෙම කාලච්ඡේදයේ ආදායම හා වියදම පිළිබඳ සංඛ්‍යා සම්පූර්ණයෙන් ලබාගැනීමට නොහැක්කේ වුවද, 1961–62 තාවකාලික අය වැය ඇස්තමේන්තු සහ රජයේ මුදල් පරිහරණය සම්බන්ධයෙන් ඇති අර්ධ සංඛ්‍යා 1961 අවසාන කාර්තුවේ දී ඇති වූ හැඩ ගැස්ම ගැන සොයා බැලීමට ප්‍රමාණවත් වෙයි.

පාර්ලිමේන්තු අනුමැතිය ලත් පරිදි 1961–62 අය වැය ලේඛනයෙන් 1960–61 අය–වැය සංඛ්‍යා ලේඛනයේ මෙන් ම මුළු අය වැය හිඟය සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු කිරීමට හා හිඟය පියවීමට යොදාගන්නා ප්‍රසාරණ මාර්ගයන් අඩුකර ගැනීමට ද අදහස් කැරිණ.

ආවර්තන වියදම් සඳහා සියයට $2\frac{1}{2}$ කද, ප්‍රාග්ධන වියදම් සඳහා සියයට 15 කද, ඌනන වියදම් සඳහා ඉඩහල පසු අය වැය ලේඛනයෙන් ඇස්තමේන්තු කළ මුළු වියදම රුපියල් කෝටි 210.61 ක් විය. මෙය රුපියල් කෝටි 13·8 කින් වැඩිය. 1961–62 මුළු වියදම වැඩි වීමට මුළු මනින්ම වාගේ හේතු වූයේ ප්‍රාග්ධන වියදම් සඳහා මුදල් වැඩියෙන් වෙන් කිරීමය මෙය 1960–61 කැරුන ප්‍රාග් ධන වියදමට වඩා රුපියල් කෝටි 13 4 කින් වැඩිවිය. ප්‍රථම වරට වර්තන වියදම් අඩු කොට ඇත. වර්තන වියදම් සඳහා වෙන්කොට ඇති ප්‍රමාණය (ඍදන් අරමුදල් දායක දීමනා හැර) කලින් වර්ෂයේ කැරෙන වර්තන වියදමට වඩා රුපියල් කෝටි 3.0 කින් අඩුය. මෙයට බෙහෙවින්ම හේතු වූයේ ආහාර ආධාර වියදම් ඇස්තමේන්තුව අඩු කිරීමය. රුපියල් කෝටි 177.67 ක ඇස්තුමේන්තු කළ ආදායමක් ලබා ගැනීම අය වැය ලේඛනයේ තවත් ඉලක්කයක් විය. මෙය 1960 – 61 ලැබුන නියම ප්‍රමාණයට වඩා රුපියල් කෝටි 26.28 කින් හෙවත් සියයට 15 කින් වැඩිය. මේ අනුව දළ අය වැය හිඟය රුපියල් කෝටි 32. 94 ක් වෙයි. දේශීය වෙළෙඳ පොළෙන් හා දේශීය ආධාර මගින් මේ වියදම පියවීම සඳහා ඇස්තමේන්තු අනුව දේශීය වෙළෙඳ පොළෙන් රුපියල් කෝටි 20 ක් හා විදේශීය ආධාර මගින් රුපියල් කෝටි 14.0 ක් ලබා ගැනීමට බලාපොරොත්තු විය.

1961 – 62 ආදායමෙන් වැඩි හරියක්ම බදු මගින් ලබා ගැනීමට දැඩි උත්සාහයක් දරා ඇත. ඇස්තමේන්තු අනුව වැඩි වූ ආදායමෙන් රුපියල් කෝටි 17. 5 ක් පමණ අලුත් බදු සහ අතිරේක බදු මාර්ගයෙන් ලබා ගත යුතුව ඇත. මෙම විධිවිධාන වලට රුපියල් කෝටි 2.5කට ඇස්තමේන්තු කොට ඇති රුපියල් 300/–කට වැඩි මාසික වැටුප් ලබන අයගේ දළ වැටුපෙන් ලබා ගන්නා සියයට 4 ජේ ජාතික සංවර්ධන බද්ද රුපියල් කෝටි 3·67 කට ඇස්තමේන්තු කොට ඇති ව්‍යාපාර නාම ලියා පදිංචි කිරීමේ බද්ද, හා වෘත්තීය බද්ද වෙනුවට ස්වයං සේවාවන්හි නියුතු වූවන් ලියා පදිංචි කිරීමේ බද්ද ද රුපියල් කෝටි 4·5 ක ආදායමක් ලැබ් යයි ඇස්තමේන්තු කැරුන විකුණුම් බද්ද ද, රුපියල් කෝටි 0.1 කට ඇස්තමේන්තු කැරුන නියමිත උපරිමයකට වැඩි ආදායම් කෙරෙහි වූ සියයට 100 අධි බද්ද ද, ඇතුළත් වෙයි. මෙයට අමතරව මත්ද්‍රව්‍ය හා දුම්කොළ වෙනුවෙන් බදු වැඩිකළ අතර වස්තු ඉඩම් හා ආදායම් 'බදුවල සීමාවන් තවත් පුළුල් කැරිණි.

22451
21 APR 2009
LIBRARY

මේ අවස්ථාවේ දී, 1961–62 අයවැය ලේඛනයෙන් ලැබෙන ආදායම් පිළිබඳ නිවැරදි ඇස්තමේන්තුවක් සැපයීම උගහටය. එහෙත් දැනට පෙනෙන තත්වය අනුව මුල් ඇස්තමේන්තුවලට වඩා ආදායම අඩු වේ යැයි සැලකිය හැකිය. රබර් හා තේ මිල අඩුවීම අපනයන බදු වලින් ලැබෙන ආදායම කෙරෙහි අවාසි සහගත ලෙස බලපෑ හැකිය. එසේම ආනයන පරිමාව හා වටිනාකම අඩුවීම නිසා ආනයන බදු වලින් ලැබෙන ආදායමද අඩු වන්නට පිළිවන. රුපියල් කෝටි 4·5 ක ආදායමක් ඇස්තමේන්තු කැරුන විකුණුම් බද්ද තවම ක්‍රියාත්මක කොට නොමැත. මේ අතර අලුත් පරිපාලන ප්‍රශ්න හා අනෙකුත් කරුණු අලුත් බදු කෙරෙහි බලපෑමට ඉඩ තිබේ. මේ සමගම, අතිරේක වැය ශීර්ෂ නිසා මුළු වියදම් ප්‍රමාණය තවත් වැඩිවීමට පිළිවන. 1961 දෙසැම්බර් මාසයේ දී සීනි මිල අඩු කිරීම හා තවත් කරුණු නිසා ඇස්තමේන්තු කළ ආහාර ආධාර වියදම් වැඩිවීමට පිළිවන. විදේශීය ආධාර ඇස්තමේන්තුව සකසා ඇත්තේ බොහෝ දුරටම දැනටමත් ගිවිසගෙන ඇති ගිවිසුම් අනුවය. මේ ආධාර යම්කිසි සංවර්ධන ක්‍රමයකට අදාළ වූයේ නම් එකී සංවර්ධන සඳහා කැරෙන වියදම් අඩු වුවහොත් ලැබෙන ආධාර ප්‍රමාණය ද අඩු විය හැකිය.

එබැවින් දැනට පෙනෙන පරිදි, 1961–62 දළ අයවැය හිඟය අයවැය ලේඛනය ඉදිරිපත් කිරීමේ දී අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා වැඩිවීමට ඉඩ තිබේ. එසේම මේ හිඟය පියවා ගැනීමට ප්‍රසාරණ මාර්ගවලින් ණය ලබා ගැනීමටත් අවශ්‍ය විය හැකිය. 1961 ඔක්තෝබර් මුල හා දෙසැම්බර් අවසානය අතර කාලය තුළ දී නොබේරූ බිල් පත් ප්‍රමාණය රුපියල් කෝටි 2·5 කින් ද මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත් රුපියල් කෝටි 1·3 කින් ද වැඩි විය. 1961 දෙසැම්බර් 31 වැනි දිනට මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය රුපියල් කෝටි 69·36 ක් විය.

1961 දෙසැම්බර් මාසයේදී තබාගතහැකිභාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය රුපියල් කෝටි 75·0 සිට කෝටි 100·0 දක්වා වැඩි කැරිණි.

## ධන මාර්ග පිළිබඳ ප්‍රශ්නය

රජයේ මුදල් පරිහරණය සම්බන්ධයෙන් මේ කොටසෙහි එන විග්‍රහයට අනුව, අයවැය ලේඛන දෙකක් මගින් පිටපිටම අයවැය ලේඛන හිඟය, අඩුකර ගැනීමට විධිවිධාන ගණනාවක් පැනවුව ද, 1961 දී රජයේ මුදල් පරිහරණය නිසා ඇති වූ ප්‍රසාරණාත්මක බලපෑම කලින් වර්ෂ වලදීට වඩා සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු නොවූ බව හෙළි වෙයි. රජයේ ආදායම් ප්‍රශ්න කෙතරම් බරපතල ද යන්න 1961 ලංකාවේ අත්දැකීම්වලින් මනාව පැහැදිලි වෙයි. සංවර්ධන කටයුතු සඳහා වසරින් වසර රජයේ වියදම වැඩිවන ආකාරය ගැන සලකන විට, මේ වියදම් පියවා ගැනීමට ඇති ධන මාර්ගයන් වහාම වැඩිදියුණු කර ගැනීම අත්‍යාවශ්‍ය වී ඇත.

මේ වියදම් සඳහා ප්‍රසාරණාත්මකමාර්ගවලින් උචිත ප්‍රමාණයට වඩා මුදල් ගැනීම මගහරවා ගැනීමට නම්, වියදම් සඳහා මුදල්, බැංකු නොවන දේශීය මාර්ගයන්ගෙන් ණය ගැනීමෙන්, විදේශීය ආධාර වලින්හා ආදායමෙන් වර්තන වියදම් හැර, ඉතිරිවන මුදල් ආදියෙන් ලබාගත යුතුව ඇත. අනාගතයේ දී දේශීය ණය ගැනීම් හා විදේශීය ආධාර වැඩි කර ගැනීම සඳහා බොහෝ ඉඩකඩ ඇති බව පිළිගත යුතුය. අර්ථ ක්‍රමය වෙනස් වීමෙන් හා ආදායම වැඩිවීමෙන් ගෘහස්ථයන්ගේ සහ ව්‍යාපාරවල ඉතිරි කිරීම් වැඩි වෙයි. මෙසේ වැඩිවන ඉතිරි කිරීම් අර්ථ සාධක සහ රක්ෂණ අරමුදල් මාර්ගයෙන් රජයට, ණය වශයෙන් ලබා ගත හැකිය. එසේම සැලසුම් කොට ඇති සංවර්ධන යෝජනා හැඩ ගැසී ක්‍රියාත්මක වන අවධියට පැමිණි විට පිටරටින් ණය ලබා ගැනීමේ ඇති ඉඩකඩ ද වැඩි වෙයි. සංවර්ධන කටයුතු සඳහා මේ මාර්ගයන්ගෙන් ලැබෙන මුදල පමණක් ප්‍රමාණවත් නොවන බව හෙළි වෙයි. තවද, මෙසේ ලැබෙන ආදායම වසරින් වසර වෙනස් වන අය–වැය අවශ්‍යතා අනුව ගැලපිය හැකි සේ වෙනස් වන්නේ ද නොවේ. එම නිසා සංවර්ධන වියදම් කැපී ආදායමෙන් අතිරේකව සැලකිය යුතු ප්‍රමාණයක් ඉතිරි කර ගැනීම අත්‍යාවශ්‍යයෙන්ම සිදු විය යුතු දෙයක් වනු ඇත.

වර්තන ගිණුමෙහි ආදායම් ඉතිරියක් ඇති කර ගැනීමට නම් ආදායම් වැඩිකර ගැනීම හෝ වර්තන වියදම් අඩු කර ගැනීම හෝ මේ දෙකම හෝ කළ යුතුය. මේ එක් එක් ක්‍රමයකට අදාළ වන වැදගත් කරුණු ගණනෙක් වෙයි.

අතිරේක ආදායම් ලබා ගැනීමට උත්සාහ කිරීමේ දී මුහුණ පෑමට සිදුවන දුෂ්කර ප්‍රශ්න ගණනාවකි. ප්‍රථමයෙන්ම, 1960-61 සහ 1961-62 අයවැය ලේඛන වලින් කැරුන පරිදි ආදායම් වැඩි කර ගැනීම සඳහා අලුත් බදු බොහෝවක් පැනවීමට අවශ්‍ය වෙයි. එසේ කිරීමේ දී ව්‍යවස්ථා හා පරිපාලන ගැටළු නියතයෙන්ම උද්ගත විය හැකිය. ව්‍යවස්ථා ප්‍රමාදවීමේ ප්‍රශ්නය විසඳීම සඳහා අලුත් අයබදු නීති සියල්ලම වාගේ එක් පනතකට ඇතුළත් කිරීමට 1961-62 අයවැය ලේඛනයෙන් උත්සාහයක් දැරුවද පරිපාලන දුෂ්කරතාවන් නිසා ආදායම් පහළ ,වැටීමට තවත් ඉඩ තිබේ. තවද, විවිධ බදු විධි විධානයනට ව්‍යවස්ථාපිත බලය ප්‍රමාණවත්ව ලබා ගැනීමේ දී ඇතිවන දුෂ්කරතා මැඩලීම සඳහා එකම මූල්‍ය පනතක් උපාය කොට ගත යුතුය.

පිට පිට අලුත් බදු පැනවීම නිසා මුළු බදු ක්‍රමයේ ස්ථිරතාවය හා·යෝග්‍යතාව කෙරෙහි බලපෑමක් ඇතිවිය හැකිය. 1958 දී ආදායම, වියදම හා දේපොළ පිළිබඳව පූර්ණ බදු ක්‍රමයක් පැනවීමෙන් ලංකාවේ අවක්‍ර බදු ක්‍රමය මූලික වශයෙන් සංශෝධනය කරන ලදී. එහෙත් විශේෂයෙන්ම, මුල් අවස්ථාවේ දී මේ ක්‍රමයෙහි ඇති වූ සමහර දුහුඹුකම් නිසාත්, අතිරේක ආදායම් ලබා ගැනීම අත්‍යාවශ්‍ය වූ නිසාත් තුවත් බදු ගණනාවක්ම පරිපූරක වශයෙන් පැනවීමට සිදු විය. විටින් විට අළුත් බදු පැනවීමේ අවශ්‍යතාවය නිසා එසේ කැරෙන වෙනස්කම් බදු ක්‍රමයකට උචිත අන්දමට ගලපා සමතුලිතතාවය ඇති කිරීම පිණිස මුළු බදු ක්‍රමයම නිතර නිතර පරීක්ෂා කළ යුතුය. එසේ නොකළහොත් අර්ථ ක්‍රමයෙහි කාර්යක්ෂමතාවට සහ බලාපොරොත්තු වන ආර්ථික හා සාමාජික පරමාර්ථයන් මුදුන් පමුණුවා ගැනීමට බාධා ඇතිවිය හැකිය.

තෙවැනි වූත් වඩා වැදගත් වූත්, ප්‍රශ්නය වනුයේ සීමාසහිත බදු පදනමක් උඩ අවක්‍ර බදු මාර්ගයෙන් දිගටම වැඩි වැඩියෙන් ආදායම් ලබා ගැනීමේ ප්‍රශ්නයයි. මේ අංශයේ ඇති ඉඩ කඩ මුළුමනින් උපයෝගී කර ගනිත්ම අතිරේක වශයෙන් ඉන් ලබා ගතහැකි ආදායම අඩු වන්නට වෙයි. තවද, බදු වලින් ලැබෙන ආදායම වැඩි කර ගැනීමේ දී බදු ක්‍රමයේ පදනම ද නියමයෙන්ම පුළුල් වෙයි. මෑත දී පනවා ඇති සමහර බදු වලින් මෙසේ බදු ක්‍රමයේ පදනම දැනටමත් පුළුල් වී ඇත. එම බදු වලට ජාතික සංවර්ධන බද්ද, ඉඩම් බද්ද, ස්වයංසේවාවෙහි නියුතු වූවන් ලියා-පදිංචි කිරීමේ බද්ද ඇතුළත් වෙයි. ආනයන බදු හා විකුණුම් බද්ද වැනි අවක්‍ර බදු ද වැඩියෙන් විස්තීර්ණ වී ඇත. ආර්ථික සංවර්ධනය ඇති වෙමින් තිබෙන රටක බදු ක්‍රමයේ තිබිය යුතු එක්තරා අංගයක් නම් රටේ සංවර්ධනය ඇතිවීම නිසා මහජනයාට වැඩියෙන් ලැබෙන ආදායමින් කොටසක් නැවත ලබාගැනීමේ හැකියාවය. මෙසේ වැඩිවන ආදායම පුළුල් ලෙස විසිරී නම් සීමිත පදනමක් මත ගොඩ නැගුණ බදු ක්‍රමයක් ඒ සඳහා එතරම් ප්‍රමාණවත් වන්නේ නොවේ.

මෙසේ ආදායම් ලබා ගැනීමේ අංශයෙහි ඇති වන ප්‍රශ්නවලට අමතරව සංවර්ධනය සඳහා මුදල් ලබා ගැනීමේ මාර්ගයක් වශයෙන් වර්තන වියදම ආදායමේ ඉතිරියක් ඇති කිරීමට තැත් කරන විට වර්තන වියදම් ප්‍රමාණය පිළිබඳ ප්‍රශ්නය මතු වෙයි. ප්‍රමාණවත්ව ආදායම් වැඩිකර ගැනීම වසරින් වසර දුෂ්කර වන බැවින් ආදායම් අතිරික්තයක් ලබාගත, හැක්කේ වර්තන වියදම් අඩු කිරී-මෙන් පමණි. මෑත වර්ෂවල දී බදු වැඩි කිරීමෙන් ලබාගත් ආදායමේ වැඩිහරියක්ම වැය වී ඇත්තේ නොකඩවා; වැඩි වූ වර්තන වියදම් සඳහාය. මෙම වියදම්වලට පාලන, සමාජ සේවා හා සංවර්ධන කටයුතු සඳහා වූ වර්තන වියදම්පමණක් නොව පාරිභෝගික හා නිෂ්පාදක ආධාර හා රජයේ ව්‍යාපාරවලින්වූ පාඩු පිරිමැසීමට දැරූ වියදම්ද ඇතුළත් වෙයි. මතුවටත්, තෝරාගත් අංශයන්හි වර්තන වියදම් නොකඩවා වැඩිවීම නොවැළැක්විය හැකිය. දැඩි ප්‍රතිපත්තියක් මත පිහිටා මුළු වර්තන වියදම සාර්ථක අන්දමින් සීමා කළේ හෝ අඩු කළේ හෝ නැති නම්, අයබදු මාර්ගයෙන් සංවර්ධනය සඳහා වැඩි ආදායමක් ලබා ගැනීමට දරන උත්සාහය පහසුවෙන්ම ව්‍යර්ථ වී යාහැකිය. මෙහි අවසන් ප්‍රතිඵලය වශයෙන් සංවර්ධන වේගය අඩු වී යා හැකිය. නැතිනම් රටපුරාම සමුච්චිත මිල සහිත උද්ධමනයක් ඇතිවිය හැකිය.

## (ආ) වෙළෙඳ බැංකු ණය දීමේ ප්‍රසාරණාත්මක බලපෑම

රජයේ මුදල් පරිහරණය නිසා අභ්‍යන්තර මූල්‍ය තත්වයෙහි ඇති වූ ප්‍රසාරණාත්මක බලපෑම පසුගිය කොටසෙහි විග්‍රහ කරන ලදි. බැංකු ක්‍රමය මගින් රජයට දෙන ලද ණය පමණක් නොව බැංකු විසින් පෞද්ගලික අංශයට මවා දෙන ලද ණය ද මුදල් ප්‍රසාරණයෙහිලා හේතු වන්නෙකි. 1961 වර්ෂයට පෙරාතුවම වූ වර්ෂවල පෞද්ගලික අංශයට වෙළෙඳ බැංකු විසින් දෙන ලද ණය නිසා එක්තරා ප්‍රසාණයක් ඇති වුවද, අය වැය හිඟයන් නිසා ඇති වූ ප්‍රසාරණය හා සසඳන විට එය එතරම් විශාල නොවේ. විදේශීය සංචිත අයහපත් වීම නිසා බැංකුවල ද්‍රවශීලතාවය සීමා වුවද, අයවැය හිඟයන් බැංකුවල ද්‍රවශීලතාව වැඩි කිරීමෙහිලා බොහෝදුරට ඉවහල් විය.

බැංකුවලින් පෞද්ගලික අංශයට ණය දීම මුදල් ප්‍රසාරණයෙහිලා බල පවත්-වන සාධකයක් වශයෙන් එතරම් වැදගත් නොවූවද, අයවැය හිඟයක් හා සසඳ බලන විට එය තවත් හැකි පමණ අඩු කර ගැනීමේ අවශ්‍යතාවයක් එළඹ තිබිණි. 1961 දී ආනයන පරිමා සීමා පැනවීමත් ඒ හේතු කොට ගෙවුම් ශෙෂයෙහි වර්තන ගිණුම් හිඟය, අඩුවීමත්, නිසා මේ පරමාර්ථයට වැදගත් තැනක් හිමිවිය. අය-වැය හිඟයන් නිසා ප්‍රසාරණයක් ඇති වෙමින් තිබියදී, ගෙවුම් හිඟයෙහි ඇතිවන එවැනි අඩුවීම-කින් බැංකුවල ද්‍රවශීලතාවය තවත් වැඩි වනවා පමණක් නොව, බැංකුවල ණය දීම් පුළුල් කිරීමේ හැකියාවද වැඩි වෙයි. මෙසේ පොදුවේ ණය සීමා කිරීමේ අවශ්‍යතාවයක් තුබූ අතර, සීමා කිරීම් බොහෝ සෙයින්ම, එතරම් අවශ්‍ය නොවන භාණ්ඩ හා ඵලදායී නොවන අවශ්‍යතා සඳහා දෙන ණය සඳහාම ඇතිකිරීමේ වුවමනාව ද විය. 1961 මුදල් ප්‍රතිපත්තීන් හා විධිවිධාන තීරණය කැරුනේ මේ කරුණු සැලකිල්ලට ගැනීමෙනි.

1960 අගෝස්තු මාසයේ දී මහ බැංකුව විසින් මූල්‍ය විධිවිධාන මාලාවක්ම පනවන ලදී. මේ විධිවිධාන වෙළෙඳ බැංකුවලින් දෙන ණය ප්‍රමාණය හා ණය දෙන කරුණු නිගමනය කිරීමට හා අයබදු මාර්ගයෙන් රජය විසින් පැනවූන විධිවිධාන වලට පරිපූරිකව, යෙදවීමට අපේක්ෂා කැරිණි. සමහර භාණ්ඩ ගෙන්වීමට නිකුත් කරන ණයවරලිපි සඳහා සියයට 50 ක් මුදලින් ලබා ගැනීම බැංකුවලට අවශ්‍ය විය. එසේම, කුලී පිට ගැනුම් සඳහා දිය හැකි ණය ප්‍රමාණ සීමා කිරීම සහ සමහර භාණ්ඩ ගෙන්වීමට හෝ මිලයට ගැනීමට හෝ දෙන මුළු ණය ප්‍රමාණය සීමා කිරීමට ඔවුන්ට සිදු විය. මෙයට අමතරව සාමාන්‍ය ගණයේ ණය සීමා කිරීම් ද පනවන ලදී. අත්තිකාරම් සඳහා සියයට $2\frac{1}{2}\%$ ක් වූ මහ බැංකු පොළිය සියයට 4 ට වැඩි කරන ලදී. එහෙත් අවශ්‍ය ආහාර ද්‍රව්‍ය ගෙන්වීම, මෙරට නිෂ්පාදනයට හා භාණ්ඩ පිටරට යැවීමට දෙන ණය සඳහා පොළිය අනුග්‍රහයක් වශයෙන් සියයට $2\frac{1}{2}$ ක් කැරිණි. මුළු තැන්පතු සඳහා වෙළෙඳ බැංකු විසින් තැබිය යුතු සංචිත ප්‍රමාණය ද සියයට 10 සිට සියයට 12 තෙක් වැඩිකරන ලදී.

1961 දී තව දුරටත් විධිවිධාන පැනවීමෙන්, බැංකු ණය දීම දැඩි ලෙස සීමා කරන ලදි. 1961 දී වෙළෙඳ බැංකුවලට මහ බැංකුව විසින් දෙන ණය සඳහා වූ යටකී සියයට $2\frac{1}{2}$ රේ අනුග්‍රහ පොළී ප්‍රමාණය වෙනුවට සියයට 4 පොදු පොළී ප්‍රමාණයක් පනවන ලදී. එහෙත් සමූපකාර සමිතිවල යම් යම් වර්ගවල භාවිතීය පොරොන්දු ඇප කොට ලබා ගන්නා ණය සම්බන්ධයෙන් පමණක් සියයට 3 ක පොළී ප්‍රමාණයක් බල පැවැත්විය. ඉල්ලුම් තැන්පතු සඳහා වූ සංචිත අවශ්‍යතාව මහ බැංකුව විසින් 1961 පෙබරවාරි මාසයේ දී තවදුරටත් වැඩි කරන ලදි. මුළු තැන්පතු සඳහා තැබිය යුතු සියයට 12 හේ සංචිතයට අතිරේක වශයෙන් 1961 පෙබරවාරි 1 වැනිදට තුබූ ප්‍රමාණයට වැඩි වන ඉල්ලුම්තැන්පතු වලින් සියයට 38 කට සමාන විශෙෂ සංචිතයක් තැබිය යුතු විය. මෙහි ප්‍රතිඵලය වූයේ සියලුම තැන්පතු සඳහා නියමිත ප්‍රමාණයට වඩා සියයට 50 ක සංචිතයක් ඇතිවීමය. කෙසේ වූවද, 1961 ජූලි මස සිට වෙළෙඳ බැංකුවලට නියමිත දිනක තිබෙන එනම් 1961 මාර්තු 15 වැනිදට බැංකු වෙත තිබෙන මුදල් නෝට්ටු හා කාසි ප්‍රමාණයට අධිකව තිබෙන නෝට්ටු හා කාසි ව්‍යවස්ථාපිත සංචිතයෙන් කොටසක් ලෙස ගණන් ගැනීමට ඉඩ දෙන ලදි. එහෙත් මෙම නෝට්ටු හා කාසි ප්‍රමාණය ව්‍යවස්ථාපිත සංචිතයෙන් සියයට

50 කට වඩා නොවැඩි විය යුතුය යන කොන්දේසියට යටත් විය යුතුය. තවද අපනයන ව්‍යාපාරවල නියුතු පිටරට සමාගම්වලට හැර අනෙකුත් පිටරට සමාගම් වලට දෙන ණය සහ අයිරා පහසුකම් තුනෙන් එකකින් කපා හැරීමට විනිමය පාලන දෙපාර්තමේන්තුව නියම කැරිණි.

1961 දී බැංකු ක්‍රමය විසින් පෞද්ගලික අංශයට දෙන ලද ණය මේ විධිවිධානය විසින් මෙහෙයවනු ලැබුයේ විය. එසේ වුවද, බැංකු සහ එහි සේවකයන් අතර ඝටගත් අර්බුදය නිසා දෙසැම්බර් මාසයේ බැංකු කටයුතු පිළිබඳ සංඛ්‍යා තොරතුරු ලබා ගැනීමට නො හැකි බැවින්, මේ අංශයෙහි ඇතිවූ වර්ධනය සම්පූර්ණයෙන් තක්සේරු කර බැලීම උගහටය. එබැවින් මෙහි පසුව දැක්වෙන විස්තර සකස් කැරුනේ නොවැම්බර් අවසානය තෙක් ලද සංඛ්‍යා තොරතුරු අනුවය.

1961 දී පෞද්ගලික අංශයට දෙන ලද වෙළෙඳ බැංකු ණය ප්‍රමාණයෙහි මාසික සාමාන්‍යය පසුගිය අවුරුද්දට වඩා රුපියල් කෝටි 1.2 කින් වැඩි වී ඇත. එහෙත් මෙය සවාධීන වශයෙන් හා ප්‍රාසාරණයේ ප්‍රමාණයෙන් බලන කල පසුගිය අවුරුදු වල වාර්තාගත වී ඇති ප්‍රමාණයට වඩා අඩුය. මෙය පහත සංඛ්‍යා සටහනෙන් දැක්වේ.

සංඛ්‍යා සටහන I—6

**පෞද්ගලික අංශයට දෙන ලද බැංකු ණය**

**(මාසික සංඛ්‍යා සාමාන්‍යය)**

| | 1959 | පසුගිය වර්ෂයට වඩා වූ වැඩි වීම | 1960 | පසුගිය වර්ෂයට වඩා වූ වැඩි වීම | 1961* | පසුගිය වර්ෂයට වඩා වූ වැඩි වීම |
|---|---|---|---|---|---|---|
| වට්ටම් කළ බිල්පත් .. | 119 | + 3 | 115 | — 4 | 121 | + 7 |
| ණය හා අයිරාවන් .. | 395 | + 32 | 430 | + 35 | 435 | + 5 |
| පෞද්ගලික අංශයට දෙන ලද මුළු දේශීය ණය . | 514 | + 35 | 545 | + 31 | 557 | + 12 |

* 1961 නොවැම්බර් වන තෙක් සාමාන්‍යය.

ඉහත දැක්වෙන පරිදි 1961 වෙළෙඳ බැංකු විසින් දෙන ලද මුළු ණය ප්‍රමාණයෙහි ඇති වූ සුළු වැඩිවීමෙන් වැඩි කොටස වට්ටම් කළ බිල්පත් සම්බන්ධ වූ ණය වෙයි. මෙයිනුදු ප්‍රධාන වශයෙන් ම ගැනෙන්නේ අපනයන හා ආනයන බිල්පත්ය. මෙය මීට පෙර වර්ෂවල දී ලද අත් දැකීම් වලට වඩා වෙනස් වෙයි. මෙයට පෙර බැංකු ණය මෙසේ වැඩි වීමට ප්‍රධාන හේතුව වූයේ ණය සහ අයිරාවන්ය. බැංකු ණය දීමෙහි අඩුවීමක් ඇති වූයේ වෙළෙඳ බැංකුවල මුළු ද්‍රවශීලතාවය දියුණුව පැවතියදීය. 1961 දී බැංකුවල මාසික මුළු ද්‍රවශීල වත්කම් සාමාන්‍යය රුපියල් කෝටි 37. 5 ක් විය. මෙය ගත වූ අවුරුද්දේ සාමාන්‍යයට වඩා රුපියල් කෝටි 4.2 කින් වැඩි ය. අනෙක් අතට 1959 දී හා 1960 දී බැංකුවල ද්‍රවශීලත්වය පිළිබඳ වත්කම්හි වැඩිවීම පිළිවෙළින් රුපියල් කෝටි 1. 0ක් හා රුපියල් කෝටි 2.2 ක් විය.

පැවැතෙමින් තුබූ අයවැය හිඟය හා විදේශීය ගෙවුම් අඩුවී තිබියදී බැංකු ද්‍රවශීලතාව සීමා කිරීමෙහිලා ඉවහල් වූ කරුණක් මෙහිලා විශේෂයෙන් සඳහන් කිරීම සුදුසුය. මේ කරුණ වූයේ මහජනයා මුදල් බැංකුවල තැන්පත් කරනුවා වෙනුවට නෝට්ටු හා කාසි වශයෙන් ළඟ තබා ගැනීමට දැක් වූ කැමැත්තය. මෙය පසුව විස්තර කැරේ. මෙවැන්නක් ඇති නොවන්නට, මෑත වර්ෂවල දී වෙළෙඳ බැංකුවල ද්‍රවශීල තත්වය තවදුරටත් වැඩි වන්නට ඉඩ තිබිණි.

ඉහත විස්තර කැරුනේ පෞද්ගලික අංශයට වෙළෙඳ බැංකු ණය දීම වැඩි වී ගිය සැටිය. 1961 වර්ෂයට පෙරාතුවම වර්ෂවල දී, රජයට දෙන ලද වෙළෙඳ බැංකු ණයෙහි වැඩිවීම ප්‍රමාණයෙන් එතරම් වැදගත් නොවීය. එතෙක් වෙළෙඳ බැංකු විසින් 1961 දී රජයට දෙන ලද ණය ප්‍රමාණය රුපියල් කෝටි 2·7 කින් සාමාන්‍ය වශයෙන් වැඩි වී ඇත. මෙයට ප්‍රධාන හේතුව වූයේ වෙළෙඳ බැංකු විසින් මිල දී ගත් භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය වැඩිවීමය. 1961 දී බැංකු වෙත තුබූ භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණයෙහි මාසික සාමාන්‍යය රුපියල් කෝටි 2. 2 කින් වැඩි විය. රජයට වෙළෙඳ බැංකු විසින් දෙන ලද ණය ද ඇතුළත් වුවහොත්, 1961 වෙළෙඳ බැංකු, ණය දීම්හි මුළු වැඩිවීම මෑත අවුරුදු වල ඇති වූ වැඩිවීම් හා සැසඳේ. එසේ වුවද රජයේ මුදල් පරිහරණ කටයුතු වලින් උද්ගත වන ප්‍රසාරණ බලපෑමට බැංකු විසින් රජයට දෙන ලද ණය ද ඇතුළත් වෙයි. මෙය මීට ඉහත කොටසේ දී විස්තර කැරිනි.

පෞද්ගලික අංශයට බැංකු විසින් දෙන ලද ණය ප්‍රමාණය වැඩිවීම වැළැක්වීමෙහිලා 1960 හා 1961 දී පනවන ලද සීමා කිරීම් අඩ වශයෙන් හේතු විය. ආනයන වියදම් ද අපනයන වටිනාකම්ද අඩුවීම ණය වැඩිවීමේ වේගය අඩු කිරීමෙහිලා හේතු වන්නට ඇත. ව්‍යවස්ථාපිත සංචිත වැඩි කිරීමේ බලපෑම පහත දක්වෙන උදාහරණයෙන් මඳ වශයෙන් වටහා ගත හැකිය. 1961 දී මාසික සාමාන්‍යය අනුව වෙළෙඳ බැංකුවල නියමිත මුදල් සංචිත වූයේ රුපියල් කෝටි 10·97 කි. 1960 දී මෙය රුපියල් කෝටි 10.12 ක්ව පැවැතිණි. ඒ අතර ව්‍යවස්ථාපිත සංචිතයන්ට අධිකව තිබූ සංචිත රුපියල් කෝටි 1.29 සිට රුපියල් කෝටි 0·51 දක්වා පහළ වැටිණි. 1961 ට පසු භාගයේ දී (අගෝස්තු අවසානයේ සිට නොවැම්බර් අවසානය දක්වා) වෙළෙඳ බැංකුවල අධි සංචිත ප්‍රමාණය අඩුවීමත් සමගම වෙළෙඳ බැංකු මහ බැංකුවෙන් ලබාගත් ණය ප්‍රමාණය ද වැඩිවිය. එවැනි ණයවල මාසික සාමාන්‍යය 1960 දී රුපියල් කෝටි 1·3 ක්වූ අතර එය 1961 දී රුපියල් කෝටි 1·89 තෙක් වැඩිවිය.

1961 දී මහ බැංකු පොළී වැඩිවීමත් සමගම සාමාන්‍ය පොළී මට්ටම වැඩිවීම ද වෙළෙඳ බැංකු ණය දීම් පිළිබඳව සැලකිය යුතු කරුණකි. 1960 සැප්තැම්බර් 30 වැනි දිනට නොබේරූ වෙළෙඳ බැංකු ණය වලින් සියයට 30 ක්, සියයට $4-4\frac{1}{2}$, පොළියට දුන් අතර, සියයට 31·8 ක් දෙන ලද්දේ සියයට $5\frac{1}{2}-6$ පොළියටය. 1960 සැප්තැම්බර් 30 වැනි දින සිට දෙනලද ණය වලින් සියයට 50·8 ක්ම සියයට $5\frac{1}{2}-6$ පොළියට දුන් අතර $4-4\frac{1}{2}$ පොළියට දෙනලද ප්‍රමාණය සියයට 5·1 ක් පමණකි. වෙළෙඳ බැංකු ණය සඳහා බරතැබූ සාමාන්‍ය පොළී ප්‍රමාණය 1960 සැප්තැම්බර් මාසයේ දී 5·45 ක් වූ අතර 1961 දී එය සියයට 6·16 ක් විය.

සකස් කර ගන්නා ලද මූල්‍ය විධිවිධානයන් වෙළෙඳ බැංකු වලින් පෞද්ගලික අංශයට දෙන ණය කෙරෙහි බලපා ඇත. පෞද්ගලික අංශයට මෙසේ දෙන ලද මුළු ණය ප්‍රමාණය සාමාන්‍යයෙන් වැඩි වුවද, පාරිභෝගික අවශ්‍යතා සඳහා දෙන ලද මුළු ණය ප්‍රමාණය අඩු විය. තාවකාලික සංඛ්‍යා අනුව, 1960 සැප්තැම්බර් සහ 1961 සැප්තැම්බර් අතර මූල්‍ය කටයුතු සඳහා දෙන ලද ණය රුපියල් කොටි 1·32 කින් අඩුවිය. අනෙක් අතට, අපනයන හා ආනයන ඇතුළත් වෙළෙඳ කටයුතු සඳහා ද කෘෂිකර්මාන්තය හා කර්මාන්ත සඳහා ද දෙන ලද ණය තරමක් වැඩි විය.

මෑත අවුරුදු වල දී මුදල් ප්‍රසාරණයෙහිලා බැංකු ණයදීම්වලට එතරම් සැලකිය යුතු තැනක් හිමි නොවූයෙන්, ප්‍රසාරණය සඳහා මූල්‍ය විධිවිධානවලින් යෙදිය හැකි පිළියම් ද නියතයෙන් ම සීමාසහිත විය. මෙවැනි මූල්‍ය විධිවිධාන යොදා ගත හැක්කේ, අර්ථ ක්‍රමයේ සමතුලිතතාවය නැති කරන ප්‍රධාන හේතුව වී ඇති රජයේ මුදල් පරිහරණයෙන් උද්ගත වන ප්‍රසාරණ බලපෑම් මැඩලීමට රජය විසින් ගනු ලබන විධිවිධානයට පරිපූරක වශයෙන් පමණකි. අපනයන, දේශීය නිෂ්පාදන, සහ අනෙකුත් අත්‍යාවශ්‍ය කටයුතු සඳහා මුදල් සැපයීමේ අවශ්‍යතාව නිසා බැංකු ණය දීම කපා හැරීමේ හැකියාව තවදුරටත් සීමිත වෙයි. අධික ලෙස හා විශේෂයක් නොකර කැරෙන ණය සීමාවන්ගෙන් අවසානයේ දී බලාපොරොත්තු විය හැකි ප්‍රතිඵල නොලැබී යන්නට පිළිවන.

**(ඈ) මුදල් සැපයුමෙහි වැඩිවීම.**

ඉහත කොටස්වලින් දක්වුන පරිදි ආනයන දැඩි ලෙස කපා හැරීම නිසා 1961 දී ලංකාවේ විදේශීය ගෙවුම් තත්ත්වයෙහි, පෙර වර්ෂවලදීට වඩා දියුණුවක් ඇති වුවද, ආර්ථික ක්‍රමයෙහි මූලිකව බලපවත්වන ප්‍රසාරණාත්මක වේගයන් ප්‍රමාණවත්ව අඩු වූයේ නොවේ. මේ වේගයන්ගේ ඒකාබද්ධ බලපෑම මූළු වශයෙන් රටේ මුදල් සැපැයුම කෙරෙහි හා සාමාන්‍ය මිල මට්ටම කෙරෙහි බලපා ඇති අන්දම විභාග කළ යුතුව ඇත.

මුදල් සැපයුමෙහි ඇති වූ වෙනස්වීම් පිළිබඳ සංඛ්‍යා ලැබී ඇත්තේ 1961 නොවැම්බර් මාසය තෙක් පමණකි. 1960 නොවැම්බර් මාසයේ සිට 1961 නොවැම්බර් මාසය තෙක් වූ දොළොස් මාසය තුළ මුදල් සැපයුමෙහි ඇතිවූ වෙනස්කම් සහ ඊට තුඩු දුන් හේතුන් සංසන්දනය සඳහා පහත සටහනේ දක්වා ඇත.

සංඛ්‍යා සටහන I–7

**මුදල් සැපයුම**

රුපියල් දශලක්ෂ

| (කාලච්ඡේදය අවසානයේදී) | 1960 නොවැම්බර් | 1961 නොවැම්බර් |
|---|---|---|
| මූළු මුදල් සැපැයුම .. .. | 1219·5 | 1251·1 |
| පසුගිය දොළොස් මාසය තුළ වූ වෙනස්වීම් (ශුද්ධ) .. | + 50·0 | + 31·6 |
| **ප්‍රසාරණාත්මක හේතු** | | |
| (අ) රජය බැංකු ක්‍රමයෙන් ගත් ණය .. | 225.7 | 219.0 |
| (ආ) පෞද්ගලික අංශයට දුන් වෙළෙඳ බැංකු ණය .. | 26.9 | — |
| (ඇ) රජයේ මුදල් ශේෂ .. .. | 38·0 | — |
| (ඈ) අනෙකුත් .. .. | 1·6 | 0·8 |
| එකතුව .. | 292·2 | 219·8 |
| **සංකෝචන හේතුන්** | | |
| (අ) විදේශීය බැංකුවත්කම්වල වෙනස්වීම් .. | 160·3 | 98·0 |
| (ආ) කාලීන හා ඉතිරිකිරීම් තැන්පතු වැඩිවීම | 76·2 | 23·8 |
| (ඇ) පෞද්ගලික අංශයට දුන් වෙළෙඳ බැංකු ණය .. | — | 3·1 |
| (ඈ) රජයේ මුදල් ශෙෂ .. .. | — | 46·0 |
| (ඉ) අනෙකුත් .. .. | 5·6 | 17·2 |
| එකතුව .. | 242·1 | 188·1 |

ඉහත සඳහන් කළ පරිදි 1961 දී මුදල් සැපැයුම වැඩිවෙමින් පැවැතිණි. පසුගිය වර්ෂවලදී මෙන්ම මේ වැඩිවීමට හේතු වූ ප්‍රධාන ප්‍රසාරණාත්මක හේතුව වූයේ අය – වැය හිඟය පියවා ගැනීම සඳහා බැංකු ක්‍රමයෙන් ණය මවා ගැනීමය. මේ සමග රටේ විදේශීය ගෙවුම් තත්වය දියුණුවීම නිසා ප්‍රසාරණාත්මක බලපෑම මකාලන සාධකයක් වන පිටරට ගෙවීම් ද අඩුවිය. පිටරට යවන භාණ්ඩවල මිල අඩු නොවන්නට, මුදල් ප්‍රසාරණය කෙරෙහි රජයේ මුදල් පරිහරණයෙන් ඇතිවන බලපෑම වැඩිවන්නට තිබිණි. අපනයන අඩුවීම නිසා ආනයන ද අඩුවීමෙන් අවාසි සහගත ගෙවුම් තත්වයක් උදාවිය.

මෑත දී ඇති වූ මුදල් ප්‍රසාරණයේ එක්තරා ලක්ෂණයක් නම්, ඉල්ලුම් තැන්පතුවලට වඩා ව්‍යවහාර මුදල් ප්‍රමාණය වැඩිවීමය. මෙය සමහර විට මුදලින් ලැබූ ආදායම බැංකු පහසුකම් එතරම් නැති ජනකොටස් අතර බෙදී ගිය බවට ලකුණක් විය හැකිය. තවද, වැඩිවූ ආදායම බැංකුවල ඉල්ලුම් තැන්පතු වශයෙන් නොව, ව්‍යවහාර මුදල් වශයෙන් ළඟ තබා ගැනීමට කැමැත්ත දක්වීමේ ලකුණක් ද විය හැකිය.

1961 දී ද මූළ මුදල් සැපැයුමෙහි වූ ව්‍යවහාර මුදල් ප්‍රමාණය වැඩි වෙමින් පැවැතිණි. 1960 දී ව්‍යවහාර මුදල් ඉල්ලුම් තැන්පතු ද එසේ වැඩිවිය. එහෙත් 1961 දී ඉල්ලුම් තැන්පතුවල නියත අඩුවීමෙක් විය. වෙනත් ලෙසකින් කියත්නේ නම් මුදල් සැපයුමෙහි වැඩිවීම මුළුමණින්ම සමන්විත වූයේ ව්‍යවහාර මුදල්වලිනි. ඉහත සඳහන් කළ හේතුන්වලට අමතරව, අපනයන අඩුවීම ද මෙයට හේතු වූවා විය හැකිය.

1961 මුදල් සැපයුමෙහි සැකැස්ම සහ ඇති වූ වෙනස්වීම් පහත පිඩුකොට දක්වා ඇත.

සංඛ්‍යා සටහන I—8

**මුදල් සැපැයුම**

රුපියල් දශ ලක්ෂ

| | 1960 දෙසැම්බර් | 1961 නොවැම්බර් | වෙනස |
|---|---|---|---|
| මුළු මුදල් සැපැයුම .. .. .. | 1,208·9 | 1,251·1 | + 42·2 |
| භාවිතයෙහි පවත්නා ව්‍යවහාර මුදල් .. | 595·3 | 665·1 | + 69·8 |
| ඉල්ලුම්තැන්පතු .. .. .. .. | 613·6 | 586·1 | — 27·5 |
| මුදල් සැපැයුමෙහි, ව්‍යවහාර මුදල් සියයට ගණන .. .. .. | 49·2 | 53·2 | |

ඉල්ලුම් තැන්පතුවලට වඩා ව්‍යවහාර මුදල් අනුපාතය වැඩිවීම, ලංකාවේ බැංකු ක්‍රමය වර්ධනයෙහි ලා එතරම් යහපත් නොවේ. ඉල්ලුම් තැන්පතු වැඩිවීම නිසා බැංකුවල ණය මවා දීමේ හැකියාව වැඩි වුවද, මෙයින් විශාල කොටසක් මූල්‍ය අධිකාරීන්ගේ පාලනයට යටත් කළ හැකිය. අනෙක් අතට බැංකුවල මුදල් තැන්පත් කිරීමේ පුරුද්ද දුබලවීම නිසා මූල්‍ය විධිවිධාන දැඩි ලෙස යෙදවීමේ ඇති ශක්තිය හීනවෙයි. භාවිතයට වැටුන වැඩි වූ ව්‍යවහාර මුදල්වල සැලකිය යුතු ලක්ෂණයක් වූයේ රුපි: 50 සහ 100 වටිනාකම්වල නෝට්ටු ප්‍රමාණය වැඩිවීමය. මෙය ලොකු ගනු - දෙනු සඳහා වැඩිවශයෙන් ව්‍යවහාර මුදල් භාවිතයේ ලකුණක් සහ මුදල් ද්‍රවශීල වත්කම් වශයෙන් ලඟ තබා ගැනීමට දක්වන ආශාවේ ලකුණක් වියහැකිය.

## (ඈ) මිල පැවැති පිළිවෙළ

මීට පෙර අවුරුදුවලදී, මුදල් ප්‍රමාණය වැඩිවීම නිසා උද්ගත වූ අධික පාරිභෝගික ඉල්ලීම්වලින් සැලකිය යුතු ප්‍රමාණයක් සපුරාගනු ලැබුයේ ආනයන පරිමාව වැඩි කර ගැනීමෙනි. ආනයන පරිමාව වැඩි කර ගැනීමට හැකි වූයේ විදේශීය වත්කම් අඩු කර ගැනීමෙනි. පිටරටින් ගෙන් වූ භාණ්ඩ වැඩිවීම මුදල් ප්‍රසාරණය නිසා මිල මට්ටම කෙරෙහි ඇති වන බලපෑම වලක්වාලීමෙහි ලා බොහෝ දුරට උපකාරී විය. එහෙත් 1961 දී ආනයන පරිමාව සීඝ්‍රයෙන් අඩුවීමත් සමගම මේ තත්වයෙහි මූලික පදනම වෙනස්වී ගියේය. මුදල් ප්‍රසාරණයට තුඩු දුන් හේතුන් එසේම තිබිය දී ආනයන භාණ්ඩ ප්‍රමාණය අඩුවීමෙන් එය මිල මට්ටම සහ වියදම් මට්ටම වැඩි කිරීමෙහි ලා බොහෝ සෙයින් බලපානු ඇත.

කෙසේ වුවද, මුදල් ප්‍රසාරණ හේතු කොට වැඩි වන මිල මට්ටම මැඩ පැවැත්වීමෙහි ලා හේතු වූ කරුණු තුනක් 1961 දී විය. එනම් පසුගිය කාලයේ ගෙන්වන ලද බඩු තොග සෑහෙන ප්‍රමාණයක් තිබීම, මෙරට නිෂ්පාදනය කළ භාණ්ඩ ප්‍රමාණය වැඩිවීම සහ අපනයන මිල අඩුවීම නිසා අපනයන අංශයේ ආදායම අඩුවීමය.

පිටරටින් ගෙන්වන භාණ්ඩ තොගවල වාර්ෂික වෙනස්වීම් ගැන නිවැරදි සංඛ්‍යා තොරතුරු ලබා ගැනීමට නොමැත. එහෙත් 1959 දී හා 1960 දී මෙරටට ගෙන් වූ භාණ්ඩ ප්‍රමාණය බොහෝ සෙයින් වැඩි විය. සමහර විට මේ වැඩිවීමෙන් කොටසක් ආනයන සීමා කරනැයි යන බලාපොරොත්තුව ඌඩ තොග රැස් කර ගැනීමේ අභිලාෂයෙන් ගෙන්වූවා විය හැකිය. ගෙන්වා රැස් කොට තිබෙන භාණ්ඩ තොග පිළිබඳ මහ බැංකුව විසින් කැරුන අර්ධ පරීක්ෂණයකින් හෙළි වූ තාවකාලික සංඛ්‍යා තොරතුරු අනුව, සමහර ප්‍රධාන පාරිභෝගික භාණ්ඩ තොග 1960 මාර්තුසහ ජූලි අතර ප්‍රමාණවත්ව වැඩි වී ඇති බව හෙළි වෙයි.

තවද 1960 අගෝස්තු වලදී සීමා කිරීමට පෙරතුව ගෙන්වීමට ඇණවූම් කරන ලද භාණ්ඩ ලැබීමෙන් අවුරුද්ද අවසානයෙහි දී ගෙන්වන ලද භාණ්ඩ ප්‍රමාණය තව දුරටත් වැඩි වන බවපෙනෙන්නට තිබිණ. මෙසේ එක් රැස් කළ බඩු තොග නිසා 1961 දී ආනයන ප්‍රමාණය අඩුවීමෙන් ඇති වූ බලපෑම අඩ වශයෙන් මැකී යන්නට ඇත.

එසේම අධික මුදල් ප්‍රසාරණය නිසා මිල මට්ටම කෙරෙහි ඇති වන බලපෑම දේශීය පාරිභෝගික භාණ්ඩ නිෂ්පාදනය වැඩිවීම නිසා මැඩ පැවැත්විය හැකිය. ජාතික ආදායම්සංඛ්‍යා අනුව 1961 දී මෙරට නිපදවන ලද පාරිභෝගික භාණ්ඩ ප්‍රමාණය මූර්ත වශයෙන් සියයට 2½ කින් වැඩිවී තිබෙන බව හෙළිවෙයි. මෙය 1960 වැඩිවීමේ ප්‍රමාණයට මඳක් අඩු වූවද, එය මිල කෙරෙහි ඇති වන බලපෑම මැඩලීමෙහි ලා උපයෝගි වන්නට ඇත. දේශීය නිෂ්පාදනය වැඩිවීම මඳ මුදල් ප්‍රසාරණයක් ඇතිකළද මිලෙහි ස්ථාවරත්වය තබා ගැනීමට උපකාරි වන්නකි.

අපනයන අංශයෙහි මිල පහළ වැටීම මුදල් ප්‍රසාරණය කෙරෙහි බලපාන්නේ වෙයි. එසේ වූවද, අපනයන ඉපැයීම් පහළ වැටීමේ දී මිල හා සබැඳුන තවත් කරුණක් වෙයි. 1961 දී අපනයන ඉපැයීම් පහළ වැටීම ප්‍රධාන වශයෙන් පොල් හා රබර් කර්මාන්තයන්හි ඇති වූ අතර, ඒ බොහෝ සෙයින් කුඩා නිෂ්පාදනයන් අතර බෙදී ගියේය. මෙය පාරිභෝගික භාණ්ඩ ඉල්ලීම කෙරෙහි බලපාන්නේ වෙයි. මේ බලපෑම තේ නිෂ්පාදනයන් වැනි ලොකු නිෂ්පාදනයන් සුළු කොටසක ආදායම පහළ වැටීමෙන් ඇති වන බලපෑමට වඩා වැඩිය.

මුදල් ප්‍රසාරණය වැඩිවීමෙන් කොතරම් ප්‍රමාණයක අතිරේක මුදලක් ද්‍රවශීල වත්කම් ලෙස ඉතිරි කොට තබා ගත්තේ දැයි නිරණය කිරීම උගහට ය. ඉහත දැක්වුන පරිදි මහජනයා වෙතැති වැඩි වටිනාකම්වල මුදල් නෝට්ටු ප්‍රමාණයෙහි වැඩිවීම මෙම සාධකය කෙතෙක් දුරට ක්‍රියාත්මක වන්නේ ද යනු අඩ වශයෙන් පෙන්නුම් කැරෙයි. 1961 දී ජාතික ආදායමට මුදල් සැපයුමෙහි වූ (විශේෂයෙන් ව්‍යවහාර මුදල් ප්‍රමාණයෙහි) අනුපාතය තරමක් වැඩිවිය. මෙයින් අදහස් කළ හැක්කේ මුදල් සැපයුම වැඩි වූවද, මුදල් හුවමාරු වේගය අඩුවීම නිසා, එහි බලපෑම තරමක් දුරට මැකී ගිය බවයි. අනෙක් අතට ඉතිරි කිරීම් ව්‍යවහාර මුදල් වශයෙන් ලඟ තබා ගන්නේ තාවකාලික වශයෙන් බවත්, එසේ තාවකාලිකව තබා ගන්නා මුදල් පාරිභෝගික භාණ්ඩ සඳහා වැය කිරීමට උපයෝගි කර ගන්නා බවත් සිතිය හැකිය.

සිල්ලර මිල හෝ තොග මිල හෝ දැක්වෙන සුදුසු දර්ශකයක් නොමැති නිසා 1961 දී මේ සාධක සියල්ල මිල මට්ටම කෙරෙහි අවශාන වශයෙන් බලපා ඇති අන්දම නිගමනයකිරීම උගහටය. මිල වෙනස්වීම මැනීම සඳහා කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය පොදු මිල මානකයක් වශයෙන් ප්‍රමාණවත් නොවේ. මක්නිසාද යත් මෙම දර්ශනයට ඇතුළත් කර ඇති භාණ්ඩ කොළඹ කම්කරු පංතියේ පවුලක පාරිභෝජනය සඳහා ගැනෙන භාණ්ඩවලට සීමා වීමයි. එසේම කම්කරු පවුලක භාණ්ඩ ලැයිස්තුවට මිල පාලනයට ගත් සහ රජයේ සහන ලැබෙන භාණ්ඩ විශාල ගණනක් අයත් වෙයි. පාරිභෝගික මිල දර්ශකයෙන් හෙළි වන සාක්ෂි අනුව 1961 මිල මට්ටම සාමාන්‍ය වශයෙන් වැඩි වී ඇතැයි නිගමනය කළ හැකි වූවද, ආනයන පරිමාවේ ඇති වූ සීඝ්‍ර අඩුවීමෙන් සැපයුමෙහි අඩුවීම නිගමනය කළේ නම් මේ මිල වැඩිවීම මෙයට වඩා වැඩි විය හැකිව තිබිණි.

ගත වූ අවුරුද්දට වඩා 1961 දී සියලුම ශීර්ෂ සඳහා වූ කොළඹ පාරිභෝගික මිල දර්ශකය මඳවශයෙන් සියයට 3.1කින් වැඩි විය. දර්ශකයට ඇතුලත් මෙරට නිපදවූ භාණ්ඩ මිල වඩාවේගයෙන් සියයට 3 ·1 කට වඩා වැඩි වූ අතර, ආනයන ගණයේ මිල මේ කාලය තුල දී සියයට 1 ·0 කින් වැඩි විය. ප්‍රධාන වශයෙන් පොල් වැනි අපනයන ගණයට අයත් භාණ්ඩයන්ගේ මිල අඩුවීම නිසා මිල දර්ශකයෙහි වැඩිවීම තරමක් දුරට බාල විය. අපනයන ගණයෙහි මිල දර්ශකය 1961 දී සියයට 14 කින් පහල වැටිණි. එහෙත් මේ ගණනට දී ඇති බර තැබීම සියයට 5 ක් නිසා මුළු දර්ශනයෙහි මේ හේතුවෙන් ඇති වූ බලපෑම් සීමා සහිත විය. දර්ශකයෙහි ඇතුලත් භාණ්ඩ ගණන වෙන් වෙන්ව ගත් කල එහි මිල විවිධාකාර වෙනස්කම්වලට මුහුණ පා ඇත. මෙසේ රෙදිපිළි, ඉන්ධන හා එළිය, විවිධ ගණයට අයත් වන භාණ්ඩ 1961 දී පිළිවෙළින් සියයට 9 ·3, සියයට 1 ·7 සහ සියයට 4 ·5 කින් ඉහල ගියේය. සියලුම ආහාර ශීර්ෂයන් සඳහා වූ මිල දර්ශකය, සියයට 1 කින් අඩු වුවද, මෙරට නිපදවනු ලැබූ ආහාර ශීර්ෂයන්හි මිල සියයට 5·6 කින් ඉහල ගියේය.

කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙන් දක්වෙන මිල වැඩිවීමෙන් සාමාන්‍ය මිල මට්ටමෙහි වූ වැඩිවීම ප්‍රමාණවත්ව පෙන්නුම් නො කරන්නට පිළිවන. එසේ වුවද, සමහර වර්ගවල පාරිභෝගික භාණ්ඩ සැලකිය යුතු අන්දමින් වැඩි වුවද, ආනයන පරිමාවෙහි ඇති වූ සීඝ්‍ර අඩුවීමට අනුරූප වන පරිද්දෙන් සාමාන්‍ය මිල මට්ටම් තියුණු ලෙස වැඩි වූ බවට සාක්ෂි නො මැත. මෙයින් අදහස් කල හැක්කේ කලින් සඳහන් කළ පරිදි මිල වැඩිවීම මැඩ පැවැත්වීමෙහි ලා හේතු වූ සාධක 1961 දී බොහෝ දුරට ක්‍රියාත්මක වී ඇති බවයි.

එහෙත් මේ සාධකයන් එකකින් හෝ සදහටම සහතය නොලැබෙන බව වටහා ගැනීම ඉතා වැදගත් වෙයි. භාණ්ඩ ගෙන්වීම සීමා වෙමින් හා මුදල් ප්‍රසාරණය වැඩි වෙමින් පවතින අවස්ථාවක, පිටරටින් ගෙන්වා රැස්කොට තිබෙන බඩු තොග වේගයෙන් අවසන් වීමට ඉඩ තිබේ. එයින් ඇතිවන භාණ්ඩ හිඟය මිල මට්ටම වැඩි කිරීමෙහි ලා බලපාන්නට පිළිවන. ආනයන සීමා කිරීම්වලට බොහෝ වර්ගවල අත්‍යාවශ්‍ය භාණ්ඩ ඇතුලත් නුවූවද සීමා කිරීම්වලට යටත් වන භාණ්ඩ ප්‍රමාණය සැලකිය යුතු ලෙස විශාලය. එබැවින් මෙයින් මිල වැඩිවීමෙක් වුවහොත් එය ව්‍යාප්තවී මුළු වශයෙන් මිල මට්ටම කෙරෙහි හා වියදම් කෙරෙහි බලපාන්නට ඉඩ තිබේ.

මිල හා වියදම් ප්‍රමාණාධිකව වැඩිවීම මුළු අර්ථ ක්‍රමය කෙරෙහිම තදබල විපාක ඇති කරලන සේ බලපෑ හැකිය. අනෙක් අතට ආදායම් ඉතා අසකුටු දයක ලෙස බෙදීයාමෙන් එය බොහෝ දුරට සමාජය කෙරෙහි බලපාන්නේ වෙයි. වැඩිවන මිල සමුච්චිතව බලපාන්නට ඉඩ ඇත. මිල වැඩිවත්ම වැඩි වැටුප් සඳහා කැරෙන ඉල්ලීම් ද වැඩි වෙයි. මෙය ඉටු කලහොත් එයින් තවදුරටත් මිල හා වියදම් වැඩිවීමෙන් අදහස් කළ කරුණු ඉටු නොවී යා හැකිය. අර්ථ ක්‍රමයෙහි අපනයන ඉතා වැදගත් තැනක් ගන්නා ලංකාව වැනි රටකට එවැනි තත්ත්වයක් විශේෂයෙන් හානිකරය. මෙරට වියදම අනුව අපේ අපනයන සඳහා ලැබෙන පිටරට මිල වැඩි නොවේ. මෙසේ වියදම් දිගටම වැඩි වුවහොත්, අපනයන අංශයෙහි තරඟකාරී හැකියාව, දුබල වීමෙන් නිෂ්පාදනය ක්‍රමයෙන් අඩුවිය හැකිය. එවිට පිටරට ගෙවුම් තත්වය සහ අය – වැය තත්වය තවත් උග්‍රවෙයි. එයින් භාණ්ඩ ගෙන්වීම තවත් අඩු කිරීමට සිදුවන අතර, මුදල් ප්‍රසාරණ හේතුන් වැඩි වී සමුච්චිත උද්ධමනයක් ඇතිවේ.

විශේෂයෙන් ලංකාව වැනි රටක, ඉහත දක්වෙන අන්දමේ තත්වයක් ඇතිවීම වලක්වා ගැනීම ඉතා වැදගත් වෙයි. ආනයන සීමා කිරීම පවතින විට ප්‍රධාන වශයෙන් අවශ්‍ය වනුයේ අර්ථ ක්‍රමයෙහි මුදල් ප්‍රසාරණය සීමා කිරීම සහ දේශීය නිෂ්පාදනය හැකිතාක් දුරට වැඩි කිරීමයයිද, මෙම පරමාර්ථ බොහෝ සෙයින් ම රජයේ මුදල් පරිහරණ කටයුතුවලට හා සංවර්ධන ප්‍රතිපත්තිවලට අදාළ වන කාර්යයෝ වෙති.

## (ඉ) පාලන විධිවිධාන

සීමා කිරීම් දිගටම පවත්වාගෙන යාමෙහිලා විස්තර කිරීමට සුදුසු තවත් කරුණක් වෙයි. සංවර්ධන වැඩ පිළිවෙලක් ක්‍රියාත්මකවී එහි උච්ච අවස්ථාව එළඹෙන විට, ප්‍රාග්ධන භාණ්ඩ හා අමු ද්‍රව්‍ය ගෙන්වීම වැඩිවීමෙන් ලංකාවේ ගෙවුම් ශේෂ කෙරෙහි

එය අධික පීඩනයක් ඇති කරයි. එබැවින් ඉදිරි කාලයේ දී අත්‍යාවශ්‍ය නොවන භාණ්ඩ සීමා කිරීමේ ප්‍රතිපත්තියක් තිබීම අවශ්‍යය. එසේ සීමා කිරීමේ ක්‍රම ප්‍රවේශමෙන් තෝරා ගැනීම ද වැදගත්ය.

බලපත්‍ර දීමෙන් සහ නියමිත කොටස් අනුව භාණ්ඩගෙන්වීමට සැලසීමෙන් භාණ්ඩගෙන්වීම සීඝ්‍රව අඩු කර ගැනීමට හැකි වෙයි. එවැනි භාණ්ඩ ගෙන්වීම අඩු කිරීමවහාම කළ යුතු නම්, මෙම ක්‍රම යොදා ගැනීම අනිවාර්යයෙන්ම සිද්ධ විය යුතුය. දිගු කාලීන ප්‍රතිපත්තියක් සඳහා මේ ක්‍රම උපයෝගී කර ගැනීමේදී එහි යම් යම් දුබලකම් ඇතිවිය හැකිය. පළමුවෙන් ප්‍රමාණ වශයෙන් වූ සීමා කිරීම්වලින් අර්ථ ක්‍රමයෙහි අනම්‍යතාවයක් ඇතිවිය හැකිය. සීමා කිරීම් සඳහා භාණ්ඩ තීරණය කිරීමේදීද ඒ අත්‍යාවශ්‍ය හා අත්‍යාවශ්‍ය නොවන භාණ්ඩ වෙන් කිරීමේ දී ද එහි අත්තනෝමතික ගතියක් ඇතිවීම නොවැළැක්විය හැකිය. එබැවින් අදහස් නොකළ ද, නොයෙක් අන්දමේ භාණ්ඩ හිඟකම් ඇතිවීමෙන් ආර්ථික කටයුතුවල කාර්යක්ෂමතාවයට හානිකර විය හැකිය. ආනයන භාණ්ඩ විශාල ගණනක් කෙරෙහි බලාපොරොත්තුවෙන් සිටින රටකට මෙය වැදගත් කරුණක් විය හැකිය.

දෙවැනිව, මීට සමානම වැදගත් කරුණක් වනුයේ ප්‍රමාණ වශයෙන් ආනයන සීමා කිරීම් නිසා ඇති වන හිඟය මිල වැඩිවීමට හේතු විය හැකි බවය. මිල වැඩිවීමේ වාසිය, භාණ්ඩ ගෙන්වන්නන්ට හා බෙදා හරින්නන්ට ලැබෙන අතර, මෙම අතිරේක ආදායම් අර්ථ ක්‍රමයෙහි මුදල් ප්‍රසාරණයට තවත් තුඩු දෙනු ඇත.

මෙසේ මිල වැඩිවීම මිල පාලනය කිරීමෙන් තරමක් මැඩ පවත්වා ගත හැකිය. පාලනනීති පැහැර හැරීම නිසා මිල පාලනය දුෂ්කරවන අතර, මෙයින් පාරිභෝගිකයාට ඇති භාණ්ඩ ප්‍රමාණය තවත් අඩුවෙයි. මේ දෙකරුණ නිසා ආනයන සීමා කිරීමේ දීර්ඝ කාලීන ප්‍රතිපත්තියක් සඳහා මෙයට වඩා නම්‍ය ක්‍රම උපයෝගී කර ගැනීමට ඉඩ කඩ තිබේ. ආනයන සඳහා බද්ද ක්‍රියාත්මකව පනවන්නේ නම් එයින් ද ආනයන ප්‍රමාණය අඩුකර ගැනීමට හැකි වෙයි. ප්‍රමාණ වශයෙන් සීමා කරනුවා මෙන් නොව මෙසේ බද්ද පැනවීමෙන් වෙනස් වන අවශ්‍යතා අනුව භාණ්ඩ සැපයීමේ නම්‍යතාවයක් ඇතිවනු ඇත. තවද්‍ර රටත් භාණ්ඩ සැපයීම අඩුවීම නිසා මිල වැඩිවීමත් සමඟ පෞද්ගලික වෙළෙන්දනට, ලැබෙන විශාල ලාභයෙන් කොටසක් රජයේ ආදායමට එකතු කර ගැනීමට ආනයන බද්ද උදව් වෙයි. රජයට ලැබෙන අතිරේක ආදායමින් කෙතෙක් දුරට අය වැය හිඟය පියවෙන්නේ ද එතෙක් දුරට මෙයින් අවධමනාත්මක බලපෑමක් ද ඇති කරයි. සමහර වර්ගවල භාණ්ඩ සඳහා පැනවෙන අධික තීරු බද්ද පාරිභෝගිකයන් ගේ වැඩි වූ ආදායමෙන් කොටසක් රජයේ ආදායමට ලබා ගත හැකි පහසු ක්‍රමයක් වෙයි. මේ ආදායම නියතයෙන් ම සංවර්ධන කටයුතු සමඟ සැබැඳී එයි.

පාලන විධිවිධාන පැනවීමේ ප්‍රශ්නය අනාගත කාර්මික සංවර්ධනය කෙරෙහි ද වැදගත් වෙයි. පසුව එන කොටසේ විස්තර කැරෙන පරිදි විදේශීය ගෙවුම් ශේෂ අවශ්‍යතා සඳහා ප්‍රමාණ වශයෙන් සීමාකිරීම් පැනවීම ආනයන භාණ්ඩ වෙනුවට භාණ්ඩ නිපදවීමේ නිරත වන කර්මාන්තයන් පිහිටුවීමෙහි ලා උනන්දු කරවන බව නිසැකයෙන් පිළිගත හැකිය. මෙය 1961 ආර්ථික සැකැස්මෙහි ඇති වූ අනාගත ආර්ථික සංවර්ධනය කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කරන කරුණකි. මෙහිදී ද, දිගු කාලීන වශයෙන් ලැබෙන ප්‍රතිඵල වැදගත් වෙයි. ලංකාවේ කාර්මික වර්ධනය සඳහා රැකවරණය අවශ්‍ය වුවද, කාර්මික අංශයෙහි ධන මාර්ග පිරිමැස්මෙන් උපයෝගී කර ගැනීම් සඳහා කර්මාන්ත පිහිටුවීම ඉතා වැදගත්ය. ප්‍රමාණ අනුව සීමා කිරීම් රැකවරණ සැලසීමේ වැදගත් ක්‍රමයක් වුවද, එහි ප්‍රතිඵල විශෙෂ ඕනෑකම් අනුව නොලැබිය හැකිය. එබැවින් එය ආනයන බද්ද වැනි වඩා නම්‍යතාවයක් ඇති ප්‍රතිපත්තිය තරම් ඵලදායී නොවන්නට ඉඩ තිබේ. අනාගත සංවර්ධනය සඳහා කාර්යක්ෂම එසේම ඔරොත්තු දෙන කාර්මික පදනමක් ඇතිකර ගැනීම අත්‍යාවශ්‍ය වෙයි. පාලන විධිවිධාන තෝරා ගැනීමේ පරමාර්ථය ළඟාකර ගැනීම සඳහා වැදගත් වෙයි.